# කාර්ය සාධන වාර්තාව - 2012

## සැකසුම -

සැලසුම් අංශය

බන්ධනාගාර මූලස්ථානය

අංක 150

බේස්ලයින් පාර

කොළඹ - 09

# පටුන


| | |
|---|---|
| 01.පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ පණිවුඩය | 1-2 |
| 02.පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශ ලේකම්ගේ පණිවුඩය | 3 |
| 03.බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය | 4-5 |
| 04.හැඳින්වීම | 6 |
| 05.ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ආයතන | 7-8 |
| 06.දැක්ම, මෙහෙවර, ඉලක්ක | 9-10 |
| 07.පාලන අංශය | 11-15 |
| 08.සංඛ්‍යාලේඛන අංශය | 15 |
| 09.ක්‍රියාකාරී අංශය | 16-29 |
| 10.සැපයුම් හා සේවා අංශය | 30-36 |
| 11.සුභසාධක අංශය | 37-52 |
| 12.ගිණුම් අංශය | 53-55 |
| 13.ඉංජිනේරු අංශය | 56-62 |
| 14.පුහුණු අංශය | 63-65 |
| 15.කර්මාන්ත අංශය | 66-67 |
| 16.බුද්ධි හා ආරක්ෂක අංශය | 68-88 |
| 17.අභ්‍යන්තර විගණන අංශය | 89 |
| 18.සැලසුම් අංශය | 90-93 |
| 19.විශේෂ සිදුවීම් | 94-97 |

# ගරු පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ඇමතිතුමාගේ පණිවුඩය.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයකට අනුව බන්ධනාගාර රැඳවියන්ගේ පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ වෙනුවෙන් විශේෂිත මෙහෙවරක් ඉටුකිරීම සඳහා වෙනමම අමාත්‍යංශයක් ලෙස මෙම අමාත්‍යංශය හඳුන්වාදීම කාලෝචිත පියවරකි. මෙම අමාත්‍යංශය තුල ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුව ප්‍රධානතම දෙපාර්තමේන්තුව වන අතර එය වත්මන් සමාජ මෙහෙවරෙහි වැදගත් කාරයභාරයක් උසුලයි.

අධිරාජ්‍යවාදී සමයේ ඇරඹුණු මෙම දෙපාර්තමේන්තුව වරදට දඩුවම් දෙන සහ රැඳවියන්ට කෲරත්වයෙන් සලකන වධකාගාරයක් සේ නිර්මාණය වුවද රැඳවියන් වරදින් මුදාගෙන පුනරුත්ථාපනය කිරීම මෙහි වත්මන් ප්‍රධාන කාර්ය භාරය සේ සලකමින් නූතනත්වයට ගැලපෙන ලෙස අපේ හරයන් සහ සංස්කෘතීන්ට අනුරූපීව සැකසීමේ මෙහෙවර උදෙසා ඉදිරි පියවර තබමින් සිටිමු.

බන්ධනාගාර ගතවූවන්ගේ කුසලතා හදුනාගනිමින් සහ නැවත නැවත බන්ධනාගාර ගතවීම වැළැක්වීම පිළිබඳ අවබෝධයක් ද ලබා ගනිමින් ඔවුන්ගේ කුසලතා දියුණුකර ගැනීමට සහාය වෙමින් යහපත් පුරවැසියන් ලෙස සමාජ ගතව ජීවත් වීමට අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව ලබාදීම සහ ඔවුන්ගේ ශ්‍රම දායකත්වය ජාතික ආර්ථික ක්‍රියාවලියට ශක්තියක් සැපයීමට දායක කර ගැනීම උදෙසා මේ දක්වා ගෙන ඇති පියවරයන් සාර්ථක ප්‍රතිඵල ලබාදී තිබීම ද සතුටට කරුණකි.

රටේ ආර්ථික සෞභාග්‍ය සදහා වැදගත් කාර්යභාරයක් ඉටුකිරීමෙහි ලා ඔවුන් සතු හැකියාවන් යොදා ගනිමින් බන්ධනාගාර ගත වූවන් විසින් මේ වන විට මිලියන 45 ක (2012 වර්ෂය අවසාන වන විට) ප්‍රමාණයක මුදලක් රජයට සපයා දීම වෙනුවෙන් ඔවුන් හට යම් අභිමානයක් ඇති කරලීමට අවස්ථාවක් සලසා දීම හා බන්ධනාගාර හා පුනරුත්ථාපන ක්‍රියාවලියට කීර්තිනාමයක් ලබාගත හැකිවීමද විශේෂත්වයකි.

බන්ධනාගාරය වෙත කවර විවේචන එල්ල වුවද කෲරත්වය පිටු දකිමින් දඬුවම වෙනුවට පුනරුත්ථාපනයත් හිංසනය වෙනුවට සංවේදීත්වයත් පදනම් කරගෙන සිරකුටිය තුළින් නිර්මාණාත්මක හැකියාවන් ඇති චරිත බිහිකිරීම සඳහා පසුගිය කාලය තුළ අප ගත් උත්සාහයේ ප්‍රතිඵල සිරකරු දිනය, දැයට කිරුළ, වෙසක් පොසොන් කලාප සහ සිපිරි රැගුම් තුළින් පැහැදිළිව දැකගත හැකි විය.

සිර කඳවුරු තුළදී රැඳවියන්ට මුහුණ දීමට සිදුවී ඇති අධික තදබද තත්වයෙන් මිදෙන අයුරින් එළිමහන් කඳවුරු හා වැඩ කඳවුරු නිර්මාණය කරමින් පහසුකම් සහිතව සිර ජීවිතය ගෙවීමට හැකිවන පරිදි ව්‍යුහගත ඉලක්කයන් සහ ඵලදායිතා සංකල්පයන් ඔස්සේ නිර්මානාත්මකව නව බන්ධනාගාර කිහිපයක් ඉදිකිරීමටත් දැනට නිලධාරීන් මුහුණ දෙන ගැටළු විසඳාලමින් ඔවුන් තුළ යහපත් ආකල්ප ඇති කිරීම උදෙසා දැක්ම පුහුණුව සමග ප්‍රායෝගිකත්වයට පත්කිරීම සඳහාත් සැලසුම් සහගතව මෙහෙවරක් සිදුවෙමින් පවතී.

මෙම කාර්යයේදී මානව සහ භෞතික සම්පත් සංවර්ධනයේ ලා කැපවීමේ ගුණය සහ ප්‍රමාණය තරඟකාරී ලෙස ඉහළ යාමක් දැකිය හැකි අතර එමගින් බන්ධනාගාර දෙපාර්තමේන්තුව දකුණු ආසියාවේ ඉහළ මට්ටමකට ගෙන ඒමට තබා ඇති ඉලක්ක ජය ගැනීම උදෙසා නිලධාරීන් වැඩි දෙනෙකුගේ කැපවීම දැකිය හැකි වීම යහපත් පෙර නිමිත්තකි.

ඒ සඳහා ජාතික ආරක්ෂාව පිළිබඳ මනා අවබෝධයකින් සහ කැපවීමකින් ක්‍රියා කරන බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුමා ඇතුළු නිලධාරි මණ්ඩලයටත් විශේෂ නායකත්වයක් සපයන අමාත්‍යංශ ලේකම්තුමා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය පල කරමි.

චන්ද්‍රසිරි ගජදීර

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

# පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශ

## ලේකම්ගේ පණිවුඩය

බන්ධනාගාර පරිපාලනය පුළුල් ප්‍රතිසංස්කරණයකට ලක්කොට බන්ධනාගාර නිලධාරීන්ගේ වෘත්තීය හා අනෙකුත් ගැටළු විසඳමින් සිරගත වූ අය නිදහස් වන විට සමාජයට අනුගත කිරීමේ නව වැඩපිළිවෙළක් හඳුන්වා දෙන්නට සපථ වූ මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශය යථාර්ථයක් කරමින් 2010 වර්ෂයේදී පිහිටුවන ලද මෙම අමාත්‍යංශයට මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යමත් දේශයක් බවට පත් කරලීමේ මහඟු කාර්යයයේදී භාරදූර වගකීමක් පැවරී ඇත.

පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩාත් විධිමත් ආකාරයෙන් සිදුකිරීමටත් ඒ තුළින් රැඳවියන්ගේ දඩුවම් කාලය අවසන් වී නැවත සමාජයට පිවිසෙන විට වඩාත් යහපත් ගුණ ධර්ම වලින් පිරිපුන් සමාජයට වැඩදායී මිනිසකු ලෙස හැඩගැස්වීම මෙම අමාත්‍යංශයේ ප්‍රමුඛතම අභිලාශය වී ඇත.

අධිකරණයකින් දඩුවම් ලද පුද්ගලයා සමාජය මගින් සිරකරුවකු ලෙස හන්වඩු ගසයි. ඒ අනුව ඔහු විශාල මානසික පීඩනයකට ලක් වීම නිරායාසයෙන්ම සිදුවේ. මෙම ඍණාත්මක තත්වය තුරන් කරනු පිණිස බන්ධනාගාර දෙපාර්තමේන්තුව ප්‍රශංසනීය සේවාවක් ඉටුකරනු ලබයි. ඒ යටතේ හැකි සෑම විටම සිරකරුගේ සමාජීය, සංස්කෘතිකමය හා ආර්ථික හැකියාවන් වර්ධනයට සුවිශේෂ අවධානය යොමු කරයි. ඒ සඳහා රැඳවියන් බලපත්‍ර මත මුදා හැරීම, නිවාස නිවාඩු වරප්‍රසාද ලබාදීම, රැඳවියන්ගේ මානසික තත්වය දියුණු කරනු පිණිස අධ්‍යාත්මික, ආගමික, උපදේශනමය හා සංස්කෘතික ක්‍රියාවන්හි නිරත කරවීමද පෙන්වා දිය හැකිය. මෙම කාර්යයන් සිරකරුවා කෙරෙහි මානුෂික දෘෂ්ටියකින් බලන සුවිශේෂ අවස්ථා ලෙසද පෙන්වා දිය හැකිය.

බන්ධනාගාරය තුල පවතින අධික තදබදයට පිළියම් සෙවීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ඇති තවත් ප්‍රධාන කාර්යභාරයකි. ඒ සඳහා නගර මධ්‍යයයේ ඇති බන්ධනාගාර නගරයෙන් බැහැරට ගෙන යාමට කටයුතු කරමින් පවතී.

අන්ධකාරයෙන් අන්ධකාරය වෙත පලවා හරිනු වෙනුවට ආලෝකය පැමිණෙන දිශාව පෙන්වා ඒ කරා ගමන් කරන්නට බන්ධනාගාර රැඳවියන් දිරිමත් කළ හැකිනම් අගය කළ යුත්තේ එයයි. හුදෙක් මානසික වදයක් වන දඩුවමක් වෙනුවට යථාවබෝධය ඇති කර යහපත් මිනිසුන් තනන පුනරුත්ථාපන ඒකකයක් බවට බන්ධනාගාරය පත්වෙමින් පවතී. 2012 වර්ෂය තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ වැඩ සටහන් වල සාරාංශයක් මෙම කාර්යසාධන වාර්තාවෙන් පිළිබිඹුවේ. මෙම සත් කාර්ය කිරීම සඳහා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ඇතුළු සියළුම නිලධාරීන් කැපවීමෙන් ඉටුකරන මෙහෙවර තවත් අධිෂ්ඨානශීලීව කරගෙන යන්නට හැකිවේවායි ප්‍රාර්ථනා කරමි.

ජී. එස්. විතානගේ

ලේකම්

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය

# බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය.

බන්ධනාගාර දෙපාර්තමේන්තුව ප්‍රතිසංස්කරණය සඳහා මහින්ද චින්තනයට අනුව යමින් වෙනම අමාත්‍යංශයක් 2010 වර්ෂයේ ස්ථාපනය විය. එම අමාත්‍යංශය යටතේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිදුකරනු ලබන ප්‍රතිසංස්කරණවලදී බන්ධනාගාර ගතවූ රැඳවියන් පුනරුත්ථාපනය කොට සමාජගත කිරීමේ මෙහෙවරට සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණවලට 2012 වසරේ ලබා දෙන ලද දායකත්වය පිළිබඳව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වශයෙන් සිහිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

මීට වසර ගනනාවකට පෙර ඉදිවූ සිර මැදිරි වර්තමාන සිර ජනගහනයට ප්‍රමානවත් නොවේ. එසේම 1986 පමණ ස්ථාපිත වූ බන්ධනාගාර කාර්යය මණ්ඩලය ද වර්තමානයට නොසෑහේ. එබැවින් 2012 වසර තුල මෙම ගැටළුවලට විසඳුම් සැපයීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස පුනරුත්ථාපනයට ගැලපෙන බන්ධනාගාර ආයතන නිර්මාණය කිරීමටත්, වර්තමානයට ගැලපෙන කාර්යය මණ්ඩලයක් ස්ථාපිත කිරීමටත්, අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීමට හැකි විය.

මේ අනුව නගර මධ්‍යයේ පවතින බන්ධනාගාර ආයතන වඩා ඉඩ පහසුකම් පවතින ප්‍රදේශවලට විතැන් කිරීමේ කාර්යය යටතේ බෝගම්බර බන්ධනාගාරය වෙනුවට පල්ලෙකැලේ ඉදිවන බන්ධනාගාරයෙහි පළමු අදියර අවසන් කොට ඇත. තවද තංගල්ලේ පවතින බන්ධනාගාරය අඟුණකොළපැලැස්සේ අක්කර 58ක භූමි භාගයක ඉදිකිරීමේ මූලික කටයුතු ආරම්භකර ඇත. මීට අමතරව කොළඹ බන්ධනාගාර පරිශ්‍රය, මාතර, ගාල්ල, ත්‍රිකුණාමළය, මීගමුව, බදුල්ල සහ මඩකළපුව යන නගර මධ්‍යයේ පිහිටුවා ඇති බන්ධනාගාර ආයතන ද වඩා ඉඩ පහසුකම් සහිත ප්‍රදේශකරා විතැන් කිරීමේ මූලික කටයුතු ආරම්භකර ඇත.

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ යටතේ පුනරුත්ථාපන කටයුතුවලට අදාල වන අයුරින් කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමේ කටයුතු දැනට අවසන් කර ඇත. මෙහි දී පුහුණු කටයුතු හා සුභසාධක කටයුතු වඩාත් පුළුල්වන ආකාරයටත්, තොරතුරු තාක්ෂණ කටයුතු බන්ධනාගර පරිපාලනයට පහසුවන ආකාරයටත්, සෞඛ්‍ය පහසුකම් වර්ධනය වන ආකාරයටත්, කාර්යය මණ්ඩලය වැඩිකර ගැනීමට පියවර ගෙන ඇත. මේ යටතේ නව කාර්යය මණ්ඩලයට කර්මාන්ත අංශය, පුහුණු අංශය, බුද්ධි අංශය සඳහා නව කොමසාරිස් තනතුරු ඇතිකර ඇති අතර සෞඛ්‍ය කටයුතු සඳහා සෞඛ්‍ය අධ්‍යක්ෂක වරයෙකු යටතේ වෙනම අංශයක් පිහිටුවීමට පියවර ගැනීමෙන් සියලු බන්ධනාගාරවල විධිමත් සෞඛ්‍ය පාලනයක් ඇතිවනු ඇත. තවද බන්ධනාගාර ආයතනවල ඉදිකිරීම් පුළුල් කිරීම සඳහා වෙනම අංශයක් අධ්‍යක්ෂ (ඉංජිනේරු) යටතේ ස්ථාපනය වනු ඇත. තාක්ෂණ කටයුතු සඳහා නව නිලධාරි මණ්ඩලයක් පත්කරන අතර මෙමගින් රැඳවියන්ගේ නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීම ඇතුළු නව පහසුකම් ඉදිරියේදී හිමිවනු ඇත. මීට අමතරව 2012 වසර තුල රැඳවියන්ගේ ආරක්ෂාව සඳහා වන කාර්යය මණ්ඩලයේත්, බුද්ධි අංශය සඳහා වන කාර්යය මණ්ඩලයේත්, සුභසාධක සහ වෙනත් අංශ සඳහාත් ඇති

වූ පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කර බන්ධනාගාර පරිපාලනය විධිමත් කලෙමි. මේ වන විට නියාමක නිලධාරීන් 423ක් බඳවාගෙන ඇත. නිලධාරීන් 67 කින් සැදුම්ලත් බුද්ධි අංශය 160ක් දක්වා වැඩි කිරීමට හැකිවිය. සෙසු පුරප්පාඩු සහ උසස්වීම් සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත.

2012 වසර තුල බන්ධනාගාර පරිපාලනය වඩා විධිමත් කිරීමේ පියවරක් ලෙස නවීන තාක්ෂණ උපකරණ ලබා දීම කෙරෙහි අවධානය යොමු කලෙමි. මෙහිදී රැඳවියන් පරික්ෂා කිරීමට සහ නිලධාරීන් පරික්ෂා කිරීමට අවශ්‍ය තාක්ෂණ උපකරණ රැසක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට හදුන්වාදීමට හැකිවූ අතර බුද්ධි අංශයේ ක්‍රියාදාමය ද සවිමත් කිරීමට පියවර ගත්තෙමි.

අපගාමී මිනිසුන් යහපත් පුරවැසියන් බවට පත් කිරීමේ තවත් පියවරක් වූ සාමාජීය සංවර්ධනය කෙරෙහි අවධානය යොමුකොට ජාතික දිනයන් වූ බන්ධනාගාර සුභසාධක දිනය, නිදහස් දිනය, මාපිය දිනය, කාන්තා දිනය, ආගමික දිනයන් ආදී සියළු විශේෂිත දිනයන් උත්කර්ෂවත් අයුරින් සැමරීම තුලින් රැඳවියන්ගේ මනස යථාවත් කිරීමට කටයුතු කලෙමි. එතුලින් ඔවුන් සාපරාධී සිතුවිලි වලින් මිදෙනු ඇතැයි යනු මාගේ විශ්වාසයයි.

මෙකී කරුනු හැරුනු කොට මා බන්ධනාගාර පාලනය රටට වැඩදායී පාලන තන්ත්‍රයක් බවට පත් කිරීමට ගත් උත්සාහයන් බොහෝ ඇත. ඒ සියල්ල පිටුපස මාගේ කාර්යය මණ්ඩලයත්, ඒ සියල්ලට ඉදිරියෙන් අප අමාත්‍යංශ ගරු අමාත්‍ය චන්ද්‍රසිරි ගජදීර ඇමතිතුමන් සහ ලේකම් තුමා ඇතළු කාර්යය මණ්ඩලයත් සිටින බව ස්තුති පූර්වකව සහිපත් කරමි.

පී. ඩබ්ලිව් කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

# <u>හැඳින්වීම</u>

**ආදර්ශ පාඨය - ආරක්ෂාව, රැකවරණය හා පුනරුත්ථාපනය**

**බන්ධනාගාර ලාංඡනය**

1832 වසරේදී කැමරන් විසින් හදුන්වාදෙන ලද අධිකරණ ප්‍රතිසංස්කරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් බනධනාගාරය බිහිවිය. ඒ අනුව 1844 අංක 18 දරණ නීති හා අධිකරණ ආඥා පනතට අනුව බ්‍රිතාන්‍ය බෝස්ටල් ක්‍රමයට අනුරූපව වැලිකඩ බන්ධනාගාරය ගොඩනැගුනි. මෙම සේවාව 1877 අංක 16 දරණ බන්ධනාගාර පනතට අනුව 1905 ජූලි 16 දින සිට බන්ධනාගාර කොමසාරිස් වරයකු යටතේ පාලනය වන වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රමවත් හා විධිමත් විය. සමාජ විකාශනයත් සමග මෙම සේවාවේ අවශ්‍යතාව තීව්‍ර විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1875 දී මහර බන්ධනාගාරයත්, 1876 දී එංගලන්ත බීන් ෆීල්ඩ් බන්ධනාගාර ආකෘතියට අනුරූපව බෝගම්බර බන්ධනාගාරයත්, ඉදිවිය. මෙලෙස විකාශිත බන්ධනාගාර පද්ධතිය වර්තමාන සමාජ සංකීර්ණත්වය හමුවේ සුවිශේෂී වූත් අත්‍යවශ්‍ය වූත් ආයතනයක් බවට පත්ව තිබේ. මේ අනුව දිවයින පුරා විසිරි, බන්ධනාගාර 03ක්, රිමාණ්ඩ් බනධනාගාර 20ක්, තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන 02ක්, තරුණ වරදකරුවන්ගේ පුහුණු මධ්‍යස්ථාන 01ක්, වැඩ කඳවුරු 10ක්, විවෘත්ත වැඩ කඳවුරු 02ක්, සිර මැදිරි 20ක්, ද වශයෙන් බන්ධනාගාර අධිකාරිවරුන් යටතේ පාලනයවේ. සිරකරුවන් සහ සැකකරුවන් 23,000ක් පමණ ඔවුන්ගේ රැකවරණය යටතේ සිටි.

වර්තමානයේ පුනරුත්ථාපන හා බනධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය යටතේ පාලනය වන මෙම දෙපාර්තමේන්තුව ප්‍රාරම්භක යුගයේ දී සිරකරුවන්ට ආරක්ෂණය හා රැකවරණය ලබා දුන්නද වර්තමානයේ ඉන් ඔබ්බට යමින් සිරකරුවන් මනා පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කරවන සමාජ ශෝධනාගාරයක් බවට පත්ව ඇත. එහිදී යහ පුද්ගල සමාජානුයෝජන කාරකයක් වූ බන්ධනාගාර දෙපාර්තමේන්තුව සිපිරි දෑතින්ම සරි කරගනමින් ඔවුන් මනාව පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස සමාජ ගත කිරීමටත ගත් උත්සාහය මෙම කාර්යසාධන වාර්තාව මගින් නිරූපනය කරයි.

ශ්‍රී ලංකා බන්ධනාගාර ආයතන - 2012



# බන්ධනාගාර ආයතන

1. **බන්ධනාගාර මූලස්ථානය**

2. **පර්යේෂණ විශෝධන පුහුණු මධ්‍යස්ථානය**

**3. ආරක්ෂිත බන්ධනාගාර - 03**

- වැලිකඩ
- බෝගම්බර
- මහර

**4. රිමාන්ඩ් බන්ධනාගාර - 20**

- අනුරාධපුරය
- කොළඹ
- කළුතර
- මීගමුව
- ගාල්ල
- නව මැගසින්
- තංගල්ල
- බදුල්ල
- මාතර
- මඩකලපුව
- නුවර
- කෑගල්ල
- ත්‍රිකුණාමලය
- යාපනය
- කුරුවිට
- බූස්ස
- මොණරාගල
- පොළොන්නරුව
- වාරියපොල
- වව්නියාව

**5. වැඩ කඳවුරු - 10**

- ★ හෝමාගම
- ★ මීතිරිගල
- ★ වනවාසල (නවෝදාව)
- ★ වීරවිල
- ★ අනුරාධපුරය
- ★ කුරුවිට
- ★ වාරියපොල
- ★ හංගිලිපොල
- ★ කන්දෙවත්ත
- ★ තුංකම

**6. විවෘත වැඩ කඳවුරු - 02**

- ○ පල්ලේකැලේ
- ○ අනුරාධපුරය

**7. තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන - 02**

- □ පල්ලන්සේන
- □ තල්දෙන

**8. තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල - 01**

- △ අඹේපුස්ස

**9. සිර මැදිරි - 20**

- ▲ අම්පාර
- ▲ අවිස්සාවේල්ල
- ▲ බලංගොඩ
- ▲ බලපිටිය
- ▲ හලාවත
- ▲ ඇල්පිටිය
- ▲ ඇඹිලිපිටිය
- ▲ ගම්පහ
- ▲ ගම්පොල
- ▲ හම්බන්තොට
- ▲ කුලියාපිටිය
- ▲ කුරුණෑගල
- ▲ මහව
- ▲ මන්නාරම
- ▲ මාතලේ
- ▲ නුවරඑළිය
- ▲ කල්මුනේ
- ▲ පානදුර
- ▲ හැටන්
- ▲ පුත්තලම

## දැක්ම

දකුණු ආසියාවේ හොඳම බන්ධනාගාර සේවය බවට ශ්‍රී ලංකා බන්ධනාගාර සේවය පත්කිරීම.

## මෙහෙවර

නේවාසිකයින්ට ආරක්ෂාවත්, රැකවරණයත් ලබාදෙමින් ඔවුන් පුනරුත්ථාපනය කිරීමත්, ඒ සඳහා නේවාසිකයින් හා බන්ධනාගාර නිලධාරීන් අතර මනා සම්බන්ධතාවයක් ගොඩනගමින් නිලධාරියාට රැකියා තෘප්තියත්, නේවාසිකයාට සුභසාධනයාත් ඇතිකොට, ඔවුන්ගේ ශ්‍රම ඵලදායීතාවය දෙපාර්තමේන්තු ස්වයං යැපුම් මට්ටමකට ගෙන ඒමටත්, රටේ සංවර්ධනයටත් යොදාගනිමින් අවසානයේ නේවාසිකයා යහපත් පුරවැසියකු ලෙස සමාජගත කිරීමයි.

# ඉලක්ක

1. බන්ධනාගාර නේවාසිකයින් විධිමත් පුනරුත්ථාපනය මගින් නීතිගරුක මානව හිතවාදී පුද්ගලයන් බවට පත්කර ශිෂ්ට සම්පන්න සමාජයක් බිහිකිරීමට දායක වීම.

2. බන්ධනාගාර නිලධාරීන් අභිප්‍රේරණය සහ දෙපාර්තමේන්තු කණ්ඩායම් හැඟීම ගොඩනැගීම.

3. බන්ධනාගාර රැදවියන්ගේ දෛනික අවශ්‍යතා වලින් 50%ක් වත් බන්ධනාගාර තුළින්ම නිපදවීම. ඒ සඳහා කෘෂි කාර්මික හා කාර්මික කටයුතු වැඩි දියුණු කිරීම.

# පාලන අංශය

බන්ධනාගාර දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු වලට බඳවාගැනීම, උසස් කිරීම, ස්ථිර කිරීම, ස්ථාන මාරුකිරීම, විනය පරීක්ෂණ පැවැත්වීම සහ නිලධාරීන්ගේ දෛනික රාජකාරි කටයුතු මෙම අංශය මගින් ඉටුකරනු ලැබේ. මීට අමතරව සිරකරුවන්ගේ ආහාර සම්පාදනය සහ බන්ධනාගාර රෝහල් පාලනය මෙම අංශය මගින් සිදුකෙරේ.

2012.12.31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තු සේවයේ නියුතු කාර්ය මණ්ඩලය - 5238 කි

2012. ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා සිදුකරන ලද පාලන කටයුතු පහත පරිදි වේ.

- **බඳවා ගැනීම්**

  නියාමක - 266 (නිලධාරි සංඛ්‍යාව)

  ඖෂධ සංයෝජක - 19 (නිලධාරි සංඛ්‍යාව)

- **උසස් කිරීම්**

  විශේෂ ශ්‍රේණියේ බන්ධනාගාර අධිකාරී තනතුරට - 02 (නිලධාරි සංඛ්‍යාව)

  බන්ධනාගාර අධිකාරී තනතුරට - 01 (නිලධාරි සංඛ්‍යාව)

  (2011.11.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2012 ජුලි මාසයේ දී උසස්වීම් ලබා දී ඇත.)

- **විදේශ ශිෂ්‍යත්ව**

  HIV / AIDS වැලැක්වීම පිළිබඳ මැලේසියා පුහුණු සංචාරය - 08 (නිලධාරි සංඛ්‍යාව)

  එක්සත් ජාතීන්ගේ 4වන ජාත්‍යන්තර විශෝධන වැඩමුළුව - ජර්මනිය - 01 (නිලධාරි සංඛ්‍යාව)

  ඕස්ට්‍රේලියාවේ අධ්‍යන කටයුතු සඳහා සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව - 01

  ඕස්ට්‍රේලියාවේ පැවති වැඩමුළුවට සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව - 01 (2012.10.03 - 2012.10.20)

- **බඳවා ගැනීම් හා උසස්වීම් මත ඇතිවන පුරප්පාඩු පිරවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග.**

  - I පෙළ සුභසාධක නිලධාරි - 05

    (අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට ඇත.).

  - සහකාර බන්ධනාගාර අධිකාරී තනතුරු - 01
  - ප්‍රධාන සුභසාධක නිලධාරි තනතුරු - 03

    (අභ්‍යන්තර උසස්වීම් සම්පූර්ණ කිරීමට 2011.11.24 දින සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත)

- සහකාර බන්ධනාගාර අධිකාරී තනතුරු (විවෘත) - 04 (විභාග පවත්වා ඇත.)

- II පෙළ සුභසාධක නිලධාරී තනතුරු - 11
  (බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇත.)
- II පෙළ ජේලර් තනතුරු - 52
  (බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය

  ඉල්ලා ඇත.)

- හෙද නිලධාරී තනතුරු - 07
  (බඳවා ගැනීම් සඳහා අයදුම්පත් කැඳවා ඇත.)
- ඖෂධ සංයෝජක නිලධාරී - 43
  (39ක් සම්පූර්ණ කිරීමට අනුමැතිය ලැබී ඇත. බඳවා ගැනීම් සඳහා අයදුම්පත් කැඳවා ඇත)

- **නියාමක නිලධාරීන් - 423**
  **(භාහිර බදවා ගැනීම් - 412 , අභ්‍යන්තර බදවා ගැනීම් - 11)**
- ඕවර්සියර් තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමට (ජ්‍යෙෂ්ඨත්වය, කුසලතාවය හා ලිඛිත විභාග මත) අයදුම්පත් කැඳවා ඇත
- බනධනාගාර දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු අවසන්කර ඇති අතර එය වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිසම වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

- විනය පරීක්ෂණ - 86 ක් අවසන් කර ඇත.
- මෙම කාලය තුල දෙපාර්තමේන්තු නිලධාරීන් 82 දෙනෙකු විශ්‍රාම ගොස් ඇත.

# 2012.12.31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය

| තනතුරු නාමය | | එකතුව | | |
|---|---|---|---|---|
| | | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| 1. | **නිලඇඳුම් ලත් කාර්යමණ්ඩලය** | | | |
| 1 | බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් | 1 | 1 | 0 |
| 2 | බන්ධනාගාර කොමසාරිස් | 3 | 2 | 1 |
| 3 | විශේෂ ශ්‍රේණියේ බන්ධනාගාර අධිකාරී | 3 | 2 | 1 |
| 4 | බන්ධනාගාර අධිකාරී | 10 | 7 | 3 |
| 5 | සහකාර බන්ධනාගාර අධිකාරී | 21 | 14 | 7 |
| 6 | ප්‍රධාන ජේලර් | 8 | 7 | 1 |
| 7 | I පෙළ ජේලර් | 40 | 36 | 4 |
| 8 | II පෙළ ජේලර් (පුරුෂ) | 267 | 210 | 57 |
| 9 | II පෙළ ජේලර් (ස්ත්‍රී) | 4 | 4 | 0 |
| 10 | ඕවර්සියර් (සුත්‍රී/පුරුෂ) | 842 | 410 | 432 |
| 11 | නියාමක (සුත්‍රී/පුරුෂ) | 4291 | 3918 | 373 |
| 12 | හෙද නිලධාරී I පංතිය | 4 | 0 | 4 |
| 13 | හෙද නිලධාරී II පංතිය | 47 | 37 | 10 |
| 14 | ඖෂධ සංයෝජක | 80 | 37 | 43 |
| 15 | කෘෂිකර්ම උපදේශක | 10 | 3 | 7 |
| 16 | කෘෂිකර්ම ඕවර්සියර් | 27 | 6 | 21 |
| 17 | කර්මාන්ත ෆෝමන් | 15 | 3 | 12 |
| 18 | 1 පෙළ වෘත්තීය උපදේශක | 48 | 29 | 19 |
| 19 | II පෙළ වෘත්තීය උපදේශක | 49 | 37 | 12 |
| 20 | කර්මාන්ත පරිපාලක | 14 | 2 | 12 |
| 21 | සරඹ උපදේශක | 3 | 2 | 1 |
| 22 | ගබඩා භාරකරු | 44 | 38 | 6 |
| 23 | මෝටර් කාර්මික | 1 | 2 | -1 |
| 24 | මෝටර් රියදුරු | 137 | 127 | 10 |
| 25 | ට්‍රැක්ටර් රියදුරු | 5 | 2 | 3 |
| 26 | වධක | 2 | 0 | 2 |

| | | | | |
|---|---|---|---|---|
| | **දළ එකතුව** | **5976** | **4936** | **1040** |
| 2. | **නිලඇඳුම් නොලත් කාර්යමණ්ඩලය** | | | |
| 1 | බන්ධනාගාර කොමසාරිස් (සුභසාධක) | 1 | 0 | 1 |
| 2 | බන්ධනාගාර කොමසාරිස් (සිවිල් පරිපාලන) | 1 | 1 | 0 |
| 3 | විශේෂ ශ්‍රේණියේ බන්ධනාගාර අධිකාරී (සුභසාධක) | 1 | 0 | 1 |
| 4 | බන්ධනාගාර අධිකාරී (සුභසාධක) | 1 | 0 | 1 |
| 5 | සහකාර බන්ධනාගාර අධිකාරී (සුභසාධක) | 2 | 2 | 0 |
| 6 | ප්‍රධාන සුභසාධක නිලධාරී | 3 | 0 | 3 |
| 7 | පුස්තකාලයාධිපති | 1 | 0 | 1 |
| 8 | 1 පෙළ සුභසාධක නිලධාරී | 8 | 3 | 5 |
| 9 | සැලසුම් සහකාර | 40 | 16 | 24 |
| 10 | 11 පෙළ සුභසාධක නිලධාරී | 129 | 115 | 14 |
| 11 | උපවැඩ පරීක්ෂක | 3 | 1 | 2 |
| 12 | සැලසුම් ශිල්පී | 1 | 1 | 0 |
| 13 | පරිගණක ක්‍රියාකරු | 3 | 2 | 1 |
| 14 | විද්‍යුත් බන්තු රේඛන ශිල්පී | 1 | 1 | 0 |
| 15 | ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර | 1 | 0 | 1 |
| 16 | වැඩ ඕවර්සියර් | 1 | 0 | 1 |
| 17 | මුරකරු | 52 | 50 | 2 |
| 18 | වතුර පොම්ප ක්‍රියාකරු | 3 | 1 | 2 |
| 19 | කම්කරු | 35 | 35 | 0 |
| | **දළ එකතුව** | **287** | **228** | **59** |
| 3. | **සිවිල් කාර්යමණ්ඩලය** | | | |
| 3.1 | **වෙනත් අමාත්‍යංශ වෙතින් අනුයුක්ත කර ඇති නිලධාරීන්** | | | |
| 1 | සංඛ්‍යා ලේඛන නිලධාරී | 1 | 1 | 0 |
| 2 | අයවැය සහකාර | 2 | 1 | 1 |
| 3 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | 1 | 1 | 0 |
| | **දළ එකතුව** | **4** | **3** | **1** |
| 3.2 | **ඒකාබද්ධ සේවයේ කාර්යමණ්ඩලය** | | | |
| 1 | අධ්‍යක්ෂ - සැලසුම් | 1 | 1 | 0 |
| 2 | ගණකාධිකාරී 1 පන්තිය | 1 | 1 | 0 |

| | | | | |
|---|---|---|---|---|
| 3 | නියෝජ්‍ය ගණකාධිකාරී | 1 | 1 | 0 |
| 4 | සහකාර ගණකාධිකාරී | 3 | 2 | 1 |
| 5 | ඉංජිනේරු (යාන්ත්‍රික) | 1 | 1 | 0 |
| 6 | ඉංජිනේරු (සිවිල්) | 2 | 2 | 0 |
| 7 | නීති නිලධාරී | 1 | 0 | 1 |
| 8 | සහකාර අධ්‍යක්ෂ (කෘෂිකර්ම) | 1 | 0 | 1 |
| 9 | ප්‍රධාන වැඩ පරීක්ෂක | 1 | 1 | 0 |
| 10 | පරිපාලන නිලධාරී | 2 | 2 | 0 |
| 11 | භාෂා පරිවර්තක | 2 | 0 | 2 |
| 12 | කළමණාකාර සහකාර සේවය | 62 | 45 | 17 |
| 13 | පොත් බැඳුම්කරු | 1 | 0 | 1 |
| 14 | කාර්යාල කාර්ය සහායක | 14 | 15 | -1 |
| 15 | බයිසිකල් පණිවුඩකරු | 2 | 0 | 2 |
| | **දළ එකතුව** | **95** | **71** | 24 |
| | **මුළු එකතුව** | **6362** | **5238** | **1124** |

## සංඛ්‍යාලේඛන අංශය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ සහ බන්ධනාගාර ගතවන නේවාසිකයින්ගේ දත්ත වාර්ථා එක්රැස් කිරීමත්, එම තොරතුරු විශ්ලේෂණය කර පවත්වාගෙන යාමත් සංඛ්‍යාලේඛන අංශය මගින් සිදුකරයි.

**2012 වසර තුළ බන්ධනාගාරයට ඇතුළත් වූ සිර/සැක සංඛ්‍යාව (දළ වශයෙන්)**

| නේවාසිකයින් | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| උසාවි මගින් ඇතුලත් කරන ලද නේවාසිකයන් | 27567 | 859 | 28426 |
| උසාවි මගින් රක්ෂිත බන්ධනාගාර ගත කරන ලද නේවාසිකයන් | 100219 | 6532 | 106751 |
| **මුළු එකතුව** | **127786** | **7391** | **135177** |

# ක්‍රියාකාරී අංශය

සිරකරුවන්ගේ පරිපාලන කටයුතු, විදේශීය සිරකරුවන් පිළිබඳ ජාත්‍යන්තර කටයුතු ඉටුකිරීම සහ සිරකරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම ආදී කාර්යයන් මෙම අංශය මගින් සිදුකරනු ලබයි. 2012.01.01 දින සිට 2012.12.31 දින දක්වා මෙම අංශයේ කාර්යසාධනය පහත පරිදි වේ.

## 1. සිරකරුවන්ගේ පරිපාලන කටයුතු

### 1.1 2012.12.31 දිනට නිදහස් කිරීම්

| නිදහස් කිරීම | සංඛ්‍යාව |
|---|---|
| බන්ධනාගාර සාමාන්‍ය සමාව | 8493 |
| විශේෂ රාජ්‍ය සමාව (නිදහස් දිනය වෙනුවෙන්) | 1385 |
| **එකතුව** | **9878** |

### 1.2. 2012.02.04 වන දින නිදහස් දිනය වෙනුවෙන් ප්‍රදානය කරනලද විශේෂ රාජ්‍ය සමාව යටතේ ඒ ඒ ආයතන වලින් නිදහස් කරන ලද රැඳවි සංඛ්‍යාව

| | ආයතනය | රැඳවියන් සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | |
| 1 | වැලිකඩ | 145 | 10 | 155 |
| 2 | බෝගම්බර | 117 | - | 117 |
| 3 | මහර | 185 | - | 185 |
| 4 | යාපනය | 08 | - | 08 |
| 5 | ත්‍රිකුණාමලය | 11 | - | 11 |
| 6 | වවුනියාව | 16 | - | 16 |
| 7 | මඩකලපුව | 21 | - | 21 |
| 8 | පොළොන්නරුව | 35 | 01 | 36 |
| 9 | අනුරාධපුර | 95 | 04 | 99 |
| 10 | වාරියපොල | 117 | 05 | 122 |
| 11 | මහනුවර රිමාන්ඩ් | - | 04 | 04 |

| | | | | |
|---|---|---|---|---|
| 12 | පල්ලන්සේන | 10 | - | 10 |
| 13 | මීගමුව | 112 | 03 | 115 |
| 14 | මැගසින් | 07 | - | 07 |
| 15 | කොළඹ රිමාන්ඩ් | 07 | - | 07 |
| 16 | කළුතර | 64 | 08 | 72 |
| 17 | හෝමාගම | 26 | - | 26 |
| 18 | කුරුවිට | 111 | 03 | 114 |
| 19 | බූස්ස | 19 | - | 19 |
| 20 | ගාල්ල | 58 | 01 | 59 |
| 21 | මාතර | 14 | - | 14 |
| 22 | තංගල්ල | 23 | - | 23 |
| 23 | වීරවිල | 02 | - | 02 |
| 24 | මොණරාගල | 23 | 03 | 26 |
| 25 | බදුල්ල | 28 | - | 28 |
| 26 | තල්දෙන | 11 | - | 11 |
| 27 | පල්ලේකැලේ | 22 | - | 22 |
| 28 | කෑගල්ල | 45 | - | 45 |
| 29 | අඹේපුස්ස ත.ව.අ.වි. | 11 | - | 11 |
| **එකතුව** | | **1343** | **42** | **1385** |

### 1.3 ජීවිතාන්ත සිරකරුවන්

ජීවිතාන්ත සිරකරුවන්ගේ දණ්ඩන කාලය නිශ්චිත සිර දඩුවම් වලට පරිවර්තනය කිරීම සලකා බැලීම සඳහා අවශ්‍ය වාර්ථා සකස් කරන අතර මෙම වසරේ ජීවිතාන්ත සිරකරුවන් 243 ක් වැලිකඩ සහ බෝගම්බර බන්ධනාගාර ආයතනවල රඳවා තැබීමට කටයුතු කර ඇත.

### 1.4 මරණ දණ්ඩනයට නියම වූ සිරකරුවන්

| ආයතනය | සංඛ්‍යාව | |
|---|---|---|
| | පිරිමි | ගැහැණු |
| වැලිකඩ බන්ධනාගාරය | 252 | 03 |
| බෝගම්බර බන්ධනාගාරය | 121 | - |
| මහර බන්ධනාගාරය | 01 | - |
| **එකතුව** | **374** | **03** |
| **සම්පූර්ණ එකතුව** | **377** | |

### 1.5. අත් අඩංගුවෙන් පැනයාම

අත් අඩංගුවෙන් පැනයන ලද සිර/සැකකරුවන් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සිදුකරන අතර 2012.12.31 දිනට 205 දෙනෙක් අත් අඩංගුවෙන් පැන ගොස් ඇත.

- පැනගිය සිර සංඛ්‍යාව - 147
- පැනගිය සැක සංඛ්‍යාව - 58
- නැවත අත්අඩංගුවට පත් සංඛ්‍යාව - 22

### 1.6. 2012. වසරේ පැනගිය රැඳවි සංඛ්‍යාව (පැනයාමේ ස්වභාවය අනුව)

| ආයතනය | පැනගිය ආකාරය | | | | | | | | එකතුව | නැවත අත් අඩංගුවට පත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රෝහල් වලින් | අධිකරණ වලින් | වැඩ සහන අවස්ථාවලදී | නිවාඩු නිවාස යෑමේදී | පිටත වැඩ කණ්ඩායමකදී | වෙනත් | බස් වල හා දුම්රිය ආරක්ෂණයේදී | ආයතනයේ රැඳවා තිබියදී | | |
| වැලිකඩ | 4 | 1 | 9 | 4 | 13 | 1 | 1 | 6 | 39 | - |
| කළුතර | 5 | 1 | 1 | - | 3 | - | 1 | - | 11 | 1 |
| ගාල්ල | - | - | - | - | - | - | - | 2 | 2 | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | 2 | - | 2 | - |
| තල්දෙන | - | - | 1 | - | 3 | - | - | - | 4 | - |
| තංගල්ල | 2 | - | - | - | 3 | - | - | - | 5 | - |
| කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | 1 | 3 | - | - | 2 | - | 1 | - | 7 | - |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පොලොන්නරුව | 1 | 1 | - | - | 2 | - | 1 | - | 5 | 1 |
| බෝගම්බර | 2 | 4 | 1 | - | 3 | - | - | - | 10 | 2 |
| මොණරාගල | 1 | - | 2 | - | 1 | - | - | - | 4 | - |
| යාපනය | 3 | - | - | - | 1 | - | - | - | 4 | 1 |
| වාරියපොල | 2 | 2 | - | - | 4 | - | - | - | 8 | - |
| වටරැක | - | - | 1 | - | 1 | - | - | 3 | 5 | - |
| වවුනියාව | 1 | - | - | - | - | - | - | - | 1 | - |
| වීරවිල | 1 | - | - | - | 1 | - | - | 3 | 5 | - |
| කුරුවිට | 1 | 2 | - | - | | - | - | 2 | 5 | 1 |
| කෑගල්ල | - | 1 | - | - | 2 | - | - | - | 3 | - |
| පල්ලන්සේන | - | - | - | - | 6 | - | - | 3 | 9 | - |
| පල්ලේකැලේ | - | - | 1 | - | 9 | - | - | 6 | 16 | 4 |
| බූස්ස | | - | - | - | 1 | - | - | - | 1 | - |
| බදුල්ල | 2 | 1 | - | - | 1 | - | - | - | 4 | 2 |
| මීගමුව | 2 | - | - | - | 1 | - | 2 | 1 | 6 | 1 |
| මාතර | 1 | 1 | - | - | 1 | - | - | - | 3 | - |
| මැගසින් | - | 2 | - | - | 1 | - | - | - | 3 | - |
| මඩකලපුව | - | 1 | - | - | - | - | - | 1 | 2 | - |
| මහර | 4 | 2 | 1 | 1 | 2 | - | 1 | - | 11 | - |
| අඹේපුස්ස | - | - | - | - | 3 | - | - | 4 | 7 | - |
| අනුරාධපුරය | 3 | 1 | - | - | 3 | - | - | 7 | 14 | - |
| අනුරාධපුරය එ. වැ. ක. | - | - | - | - | 6 | - | - | 3 | 9 | - |
| **එකතුව** | **35** | **23** | **17** | **5** | **74** | **1** | **9** | **41** | **205** | **13** |

### 1.7. නිවාස නිවාඩු

| ආයතනය | මාසය (ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා) | | | | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | |
| වැලිකඩ | 33 | 1 | 15 | | | | | | 2 | | 34 | | 85 |
| මැගසින් | | | | 1 | | | | | | | | | 1 |
| වටරැක | | | | 2 | | | | | 1 | 3 | | | 6 |
| මහර | | 1 | | 2 | | | | | 8 | | | | 11 |
| මීගමුව | 1 | | | | | | | | | | | | 1 |
| පල්ලන්සේන | | 13 | | 5 | | | | | | | | | 18 |
| කළුතර | 1 | | | | | 2 | | | 1 | | | | 4 |
| බෝගම්බර | | 1 | | | | | | | | 7 | 7 | | 15 |
| පල්ලේකැලේ | | | | | | | | | | | 15 | | 15 |
| ගාල්ල | | | | | | | | | | 2 | | | 2 |
| බූස්ස | | | | | | | | | 3 | | | | 3 |
| මාතර | | | | | | 1 | | | | | | | 1 |
| අනුරාධපුරය | | | | | | | | | | | 2 | | 2 |
| බදුල්ල | | | 1 | | | | | | | | | | 1 |
| තල්දෙන | | | | 1 | | | | | | | 6 | | 7 |
| මොණරාගල | | 3 | | | | | | | | | | | 3 |
| කුරුවිට | | | | 3 | | | | | 2 | 1 | | | 6 |
| **එකතුව** | **35** | **19** | **16** | **14** | **0** | **3** | **0** | **0** | **17** | **13** | **64** | **0** | **181** |

### 1.8. මාරුකිරීම්

විනය හේතූන් හා වෙනත් හේතූන් මත සිරකරුවන් මාරු කිරීම සම්බන්ධව කටයුතු කිරීම.

1.9 2012 වසර තුල ශ්‍රමදාන සඳහා යෙදවූ සිරකරුවන් සංඛ්‍යාව

| | බන්ධනාගාරය | ශ්‍රමදාන සංඛ්‍යාව | සහභාගිවූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | වැලිකඩ බන්ධනාගාරය | 84 | 955 |
| 2 | මහර බන්ධනාගාරය | 138 | 2,366 |
| 3 | මැගසින් බන්ධනාගාරය | 4 | 60 |
| 4 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | 2 | 15 |
| 5 | බෝගම්බර බන්ධනාගාරය | 73 | 1,385 |
| 6 | අනුරාධපුර බන්ධනාගාරය | 22 | 943 |
| 7 | බදුල්ල බන්ධනාගාරය | 10 | 61 |
| 8 | බූස්ස බන්ධනාගාරය | 14 | 192 |
| 9 | ගාල්ල බන්ධනාගාරය | 142 | 1,288 |
| 10 | මාතර බන්ධනාගාරය | 112 | 1,356 |
| 11 | තංගල්ල බන්ධනාගාරය | 32 | 254 |
| 12 | මඩකලපුව බන්ධනාගාරය | 9 | 60 |
| 13 | මීගමුව බන්ධනාගාරය | 4 | 30 |
| 14 | දළුපොත ත.ව.වි.ම. | 13 | 75 |
| 15 | කළුතර බන්ධනාගාරය | 21 | 358 |
| 16 | කුරුවිට බන්ධනාගාරය | 52 | 898 |
| 17 | පල්ලේකැලේ එ.සි.ක. | 28 | 275 |
| 18 | තල්දෙන ත.ව.වි.ම. | 27 | 332 |
| 19 | ත්‍රිකුණාමලය බන්ධනාගාරය | 39 | 198 |
| 20 | වීරවිල එ.සි.ක. | 126 | 1,107 |
| 21 | පොලොන්නරුව බන්ධනාගාරය. | 28 | 265 |

| | | | |
|---|---|---|---|
| 22 | වාරියපොල බන්ධනාගාරය | 25 | 456 |
| 23 | මොණරාගල බන්ධනාගාරය | 4 | 145 |
| 24 | වටරැක බන්ධනාගාරය | 56 | 375 |
| 25 | වව්නියාව බන්ධනාගාරය | 1 | 0 |
| 26 | අඹේපුස්ස ත.ව.අ.වි. | 15 | 142 |
| 27 | යාපනය බන්ධනාගාරය | 14 | 120 |
| 28 | කෑගල්ල බන්ධනාගාරය | 26 | 192 |
| **එකතුව** | | **1,121** | **13,903** |

1.10. **මියයාම්**

රැඳවුම් භාරයේ සිටියදී මියයාම් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම හා පසු කටයුතු සිදුකරන අතර 2012 වසර තුල සිර හා සැකකරුවන් 156 දෙනෙක් මියගොස් ඇති අතර සියළුම මිය යාම් සම්බන්ධව අධිකරණ වෛද්‍ය පරීක්ෂණ සහ බන්ධනාගාර පරීක්ෂණ පවත්වා ඇත. (පිරිමි සිර - 80, පිරිමි සැක - 71, ගැහැණු සිර - 02, ගැහැණු සැක - 03)

1.11. **මානව හිමිකම් පිළිබඳ පැමිණිලි හා මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු සම්බන්ධ පියවර ගැනීම**.

**2. දිවයිනේ සියළුම බන්ධනාගාර ආයතන සඳහා ආගමික කටයුතු සම්බන්ධව පූජකවරුන් පත්කිරීම**

| ආයතනය | ආගම | පත් කළ පූජකවරු සංඛ්‍යාව |
|---|---|---|
| වැලිකඩ බන්ධනාගාරය (පිරිමි/කාන්තා) | බෞද්ධ | 2 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 61 |
| | ඉස්ලාම් | 16 |
| | හින්දු | 1 |
| කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | බෞද්ධ | 1 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 28 |
| මැගසින් බන්ධනාගාරය | බෞද්ධ | 4 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 26 |
| අඟේපුස්ස ත.ව.අ.වි. | බෞද්ධ | 1 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 1 |
| | ඉස්ලාම් | 2 |
| | හින්දු | 1 |
| මහර බන්ධනාගාරය | බෞද්ධ | 1 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 12 |
| | ඉස්ලාම් | 11 |
| | හින්දු | 1 |
| දළුපොත ත.ව.වි.ම. | බෞද්ධ | 2 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 1 |
| | ඉස්ලාම් | 6 |
| | හින්දු | 2 |
| මීගමුව බන්ධනාගාරය | බෞද්ධ | 2 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 11 |
| | ඉස්ලාම් | 7 |
| | හින්දු | 1 |

| | | |
|---|---|---|
| අනුරාධපුර බන්ධනාගාරය | බෞද්ධ | 5 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 3 |
| | ඉස්ලාම් | 5 |
| | හින්දු | 1 |
| වාරියපොල බන්ධනාගාරය | බෞද්ධ | 7 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 2 |
| | ඉස්ලාම් | 5 |
| | හින්දු | 1 |
| බදුල්ල බන්ධනාගාරය | බෞද්ධ | 3 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 5 |
| | ඉස්ලාම් | 5 |
| | හින්දු | 2 |
| කුරුවිට බන්ධනාගාරය | බෞද්ධ | 6 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 2 |
| | ඉස්ලාම් | 7 |
| | හින්දු | 4 |
| ගාල්ල බන්ධනාගාරය | බෞද්ධ | 6 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 3 |
| | ඉස්ලාම් | 6 |
| | හින්දු | 1 |
| තංගල්ල බන්ධනාගාරය | බෞද්ධ | 6 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 2 |
| | ඉස්ලාම් | 5 |
| | හින්දු | 1 |
| වීරවිල එ.සි.ක. | බෞද්ධ | 5 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 6 |
| | ඉස්ලාම් | 5 |
| | හින්දු | 2 |

| | | |
|---|---|---|
| මොණරාගල බන්ධනාගාරය | බෞද්ධ | 6 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 2 |
| | ඉස්ලාම් | 3 |
| | හින්දු | 1 |
| පල්ලේකැලේ එ.සි.ක. | බෞද්ධ | 1 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 6 |
| | ඉස්ලාම් | 1 |
| | හින්දු | 6 |
| බෝගම්බර බන්ධනාගාරය | බෞද්ධ | 13 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 18 |
| | ඉස්ලාම් | 14 |
| | හින්දු | 5 |
| යාපනය බන්ධනාගාරය | බෞද්ධ | 1 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 15 |
| | ඉස්ලාම් | 5 |
| | හින්දු | 2 |
| කළුතර බන්ධනාගාරය | බෞද්ධ | 4 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 3 |
| | ඉස්ලාම් | 2 |
| | හින්දු | 1 |
| මඩකලපුව බන්ධනාගාරය | බෞද්ධ | 1 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 6 |
| | ඉස්ලාම් | 5 |
| | හින්දු | 2 |
| ත්‍රිකුණාමලය බන්ධනාගාරය | බෞද්ධ | 5 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 2 |
| | ඉස්ලාම් | 6 |
| | හින්දු | 4 |

| | | |
|---|---|---|
| මාතර බන්ධනාගාරය | බෞද්ධ | 4 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 4 |
| | ඉස්ලාම් | 2 |
| | හින්දු | 1 |
| තල්දෙන ත.ව.වි.ම. | බෞද්ධ | 6 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 5 |
| | ඉස්ලාම් | 6 |
| | හින්දු | 4 |
| වටරැක බන්ධනාගාරය | බෞද්ධ | 9 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 8 |
| | ඉස්ලාම් | 6 |
| | හින්දු | 1 |
| පොලොන්නරුව බන්ධනාගාරය. | බෞද්ධ | 8 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 2 |
| | ඉස්ලාම් | 5 |
| | හින්දු | 2 |
| වව්නියාව බන්ධනාගාරය | බෞද්ධ | 1 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 1 |
| | ඉස්ලාම් | 1 |
| | හින්දු | 1 |
| කෑගල්ල බන්ධනාගාරය | බෞද්ධ | 1 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 1 |
| | ඉස්ලාම් | 7 |
| | හින්දු | 1 |
| බූස්ස බන්ධනාගාරය | බෞද්ධ | 4 |
| | ක්‍රිස්තියානි (සියළුම නිකායන්) | 3 |
| | ඉස්ලාම් | 2 |
| | හින්දු | 1 |

## 3. විදේශීය සිරකරුවන් පිළිබඳ හුවමාරු කටයුතු ඉටුකිරීම

විදේශ ජාතික සිරකරුවන් පිළිබඳ විදේශ ආයතන හා තානාපති කාර්යාල සමග සම්බන්ධීකරණ කටයුතු පැවැත්වීම. මේ වන විට විදේශික සිර/සැක සංඛ්‍යාව 225 කි.

### 3.1 2012 වර්ෂයේ විදේශ ජාතික සිර,සැක කරුවන් ගේ විස්තර.

| අනු අංකය | ආයතනය | සිර | | සැක | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | ස්ත්‍රී | පිරිමි | ස්ත්‍රී | පිරිමි | |
| 1 | වැලිකඩ | - | 12 | 2 | 14 | 28 |
| 2 | වැලිකඩ කාන්තා අංශය | 4 | - | 39 | - | 43 |
| 3 | මාතර | - | - | - | 3 | 3 |
| 4 | තංගල්ල | - | - | - | 9 | 9 |
| 5 | බෝගම්බර | - | - | - | 2 | 2 |
| 6 | මීගමුව | - | - | 9 | 63 | 72 |
| 7 | යාපනය | - | - | - | 8 | 8 |
| 8 | කොළඹ රිමාන්ඩ් | - | - | - | 18 | 18 |
| 9 | මැගසින් | - | 1 | - | 27 | 28 |
| 10 | මොණරාගල | - | - | - | 1 | 1 |
| 11 | බදුල්ල | - | 1 | - | - | 1 |
| 12 | මහර | - | - | - | 1 | 1 |
| 13 | අනුරාධපුර | - | - | 1 | 1 | 2 |
| 14 | මඩකළපුව | - | - | - | 8 | 8 |
| 15 | මහනුවර රිමාන්ඩ් | - | - | - | 1 | 1 |
| **එකතුව** | | **4** | **14** | **51** | **156** | **225** |

### 3.2 2012 වර්ෂයේ විදේශ ජාතික සිර,සැක, කරුවන් ගේ විස්තර රටවල් අනුව

| දේශය | සිර | සැක | එකතුව |
|---|---|---|---|
| නේපාලය | 1 | 2 | 3 |
| පාකිස්ථානය | 15 | 43 | 58 |
| ඉන්දියාව | 33 | 31 | 64 |
| බංග්ලාදේශය | | 1 | 1 |
| යුක්රේන් | | 4 | 4 |
| එංගලන්තය | 1 | 3 | 4 |
| චීනය | 4 | 8 | 12 |
| ඉරානය | 1 | 4 | 5 |
| නයිජීරියා | | 12 | 12 |
| පිලිපීන් | | 3 | 3 |
| තායිලන්තය | | 3 | 3 |

| | | | |
|---|---|---|---|
| උස්බකිස්තාන් | 1 | | 1 |
| ඇෆ්ගනිස්තාන් | | 5 | 5 |
| සිංගප්පූරුව | 1 | 1 | 2 |
| ජර්මන් | | 4 | 4 |
| උගන්ඩාව | | 1 | 1 |
| ඉතාලිය | | 1 | 1 |
| මාලදිවයින | | 1 | 1 |
| සුවිසර්ලන්තය | | 1 | 1 |
| කැමරන් | | 2 | 2 |
| රුසියන් | | 5 | 5 |
| ජෝර්දාන් | | 1 | 1 |
| ඉන්දුනීසියාව | | 1 | 1 |
| තායිවානය | | 27 | 27 |
| රුමේනියාව | | 2 | 2 |
| බ්‍රිතාන්‍ය | | 1 | 1 |
| මොසැම්බික් | | 1 | 1 |
| **එකතුව** | 57 | 168 | 225 |

4. 2012 වසර තුල යුධ හමුදාවට අනුයුක්ත පලාලි යුධ හමුදා ගොවිපොලෙහි සිරකරුවන් 34 දෙනෙක් සේවයේ යෙදවූ අතර ඔවුන්ගේ වැටුප් සම්බන්ධ විස්තර පහත පරිදිවේ.

| වැටුප් විස්තරය | මුදල (රු.) |
|---|---|
| සිරකරු සුභසාධක අරමුදලට | 107,380.00 |
| රජයේ ආදායමට | 107,380.00 |
| නිලධාරි ත්‍යාග අරමුදලට | 107,380.00 |
| රණවිරු සේවා අධිකාරියට | 107,380.00 |
| වැලිකඩ බන්ධනාගාර රැඳවියන්ට | 1,435,350.00 |
| බෝගම්බර බන්ධනාගාර රැඳවියන්ට | 819,630.00 |
| **ලැබිය යුතු මුළු මුදල** | **2,684,500.00** |

5. 2012.12.31 දිනට  බන්ධනාගාර ගත එල්. ටී. ටී. ඊ. රැඳවියන් සංඛ්‍යාව

| ආයතනය | සිර | | සැක | | එකතුව |
|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | |
| වැලිකඩ බන්ධනාගාරය | 02 | 02 | - | 03 | 07 |
| මැගසින් බන්ධනාගාරය | 24 | - | 92 | - | 116 |
| කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | 02 | - | 79 | - | 81 |
| මහර බනධනාගාය | 02 | - | - | - | 02 |
| බෝගම්බර බන්ධනාගාරය | 11 | - | 23 | - | 34 |
| මහනුවර රිමාන්ඩ් බන්ධනාගාරය | - | - | - | 01 | 01 |
| අනුරාධපුර බන්ධනාගාරය | 02 | 01 | 49 | - | 52 |
| පොළොන්නරුව බන්ධනාගාරය | - | - | 04 | - | 4 |
| ත්‍රිකුණාමලය බන්ධනාගාරය | - | - | 07 | 01 | 08 |
| බදුල්ල බන්ධනාගාරය | - | - | 03 | - | 03 |
| ගාල්ල බන්ධනාගාරය | 01 | - | 02 | 02 | 05 |
| මීගමුව බන්ධනාගාරය | - | - | 15 | - | 15 |
| යාපනය බන්ධනාගාරය | - | - | 15 | - | 15 |
| **එකතුව** | **44** | **03** | **289** | **07** | **343** |

# සැපයුම් හා සේවා අංශය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ භාණ්ඩ හා උපකරණ මිළදී ගැනීම් සහ භාණ්ඩ හා උපකරණ නඩත්තු කටයුතු වල කාර්ය සාධනය 2012.01.01 දින සිට 2012.12.31 දින දක්වා පහත පරිදි වේ.

**සාරාංශය**

| වැය විෂය අංකය හා විස්තරය | භාණ්ඩ වර්ගය | වියදම (රු.) | වෙනත් |
|---|---|---|---|
| 1302- යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තුව | බන්ධනාගාර මූලස්ථානයේ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම | 606,425.82 | |
| | බන්ධනාගාර ආයතනවල යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම | 2,729,365.18 | |
| | වෙනත් (බන්ධනාගාර ආයතනයන්හි සෘජු නඩත්තු වියදම්) | 418,528.82 | |
| | **එකතුව** | **3,754,319.82** | |
| 1203-2 - නිල ඇඳුම් හා උපකරණ | නිල ඇඳුම් හා උපකරණ | 42,760,125.78 | ඇමුණුම 01 |
| | **එකතුව** | **42,760,125.78** | |
| 2002 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම් | බන්ධනාගාර මූලස්ථානයේ වියදම් | 1,264.93 | ඇමුණුම 02 |
| | බන්ධනාගාර ආයතනවල වියදම් | 1,938,898.11 | |
| | වෙනත් (බන්ධනාගාර ආයතනයන්හි සෘජු වියදම්) | 416,891.47 | |
| | **එකතුව** | **2,387,054.51** | |
| 2102- ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,835,009.97 | ඇමුණුම 03 |
| | ආරක්ෂක උපකරණ | 1,957,300.48 | |
| | තොරතුරු තාක්ෂණ උපකරණ | 9,974,138.41 | |
| | **එකතුව** | **13,766,448.86** | |
| 2103 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් | බන්ධනාගාර මූලස්ථානයට මිලදී ගැනීම් | 4,691,359.00 | ඇමුණුම 04 |
| | බන්ධනාගාර ආයතනවලට මිලදී ගැනීම් | 2,023,571.34 | |
| | **එකතුව** | **6,714,930.34** | |
| 1205 - වෙනත් | බන්ධනාගාර මූලස්ථානයට | 3,921,791.00 | |
| | බන්ධනාගාර ආයතනවලට | 2,835,569.94 | |
| | **එකතුව** | **6,757,360.94** | |
| **මුළු එකතුව** | | **76,140,240.25** | |

ඇමුණුම- 1

**<u>නිල අඳුම් හා නිල උපකරණ මිලදී ගැනීම් විස්තරය -1203-2</u>**

| විස්තරය | මුදල |
|---|---|
| නවක ජේලර් නිලධාරීන්ට අවශ්‍ය තරු, ලෙන්යාඩ්,ඇප්ලට් (1) | 33,975.00 |
| ජේලර් පාවහන් ජෝඩු 108 | 345,599.00 |
| මෝටර් රථ රියදුරු 10 දෙනෙකුට අවශ්‍ය පාවහන් | 22,560.00 |
| බුද්ධි ඒකකය සඳහා අවශ්‍ය වැහි කබා 80ක් | 164,416.00 |
| 2011 වසර සඳහා බන්ධනාගාර නිලධාරීන්ට අවශ්‍ය කාකිපාට මේස් | 2,415,813.00 |
| නියාමක නිලධාරීන්ට අවශ්‍ය හම් පටි 750ක් | 1,199,999.00 |
| නවක ජේලර් නිලධාරීන්ට අවශ්‍ය තරු, හිස්වැසුම්,ඇප්ලට් (1) | 101,500.00 |
| සුභ සාධක නිලධාරී පාවහන් දීමනාව | 3,900.00 |
| ජේලර් සැම් බ්‍රවුන් පටි 200ක් | 900,000.00 |
| ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් සඳහා සැම් බ්‍රවුන් පටි 20ක් | 90,000.00 |
| කාකිපාට කලිසම් රෙදි මීටර් 28000ක් | 9,878,400.00 |
| ඇඳ ඇතිරිලි 5000ක් | 2,800,000.00 |
| හිස්වැසුම් 04ක් | 7,000.00 |
| ජේලර් ටැග් 20, ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී ලෙන්යාඩ් 15, ජේලර් බකල් 100, ජේලර් බාර් ජෝඩු 30, VI බැජ් ජෝඩු 50, MD බැජ් ජෝඩු 20 | 75,700.00 |
| ඇප්ලට් ජෝඩු 300 | 195,000.00 |
| සපත්තු පොලිෂ් ටින් 20,000 | 1,353,600.00 |
| පටි දෙකේ ලාංඡන 750, පටි තුනේ ලාංඡන 500 | 223,750.00 |
| බන්ධනාගාර බටහිර සංගීත කණ්ඩායම සඳහා ඇඳුමක් මැසීමට | 45,375.00 |
| සුභ සාධක නිලධාරීන් දෙදෙනෙකුට සංචාරක ගමන් මළු | 6,000.00 |
| සුදු පාට අත් දිග බැනියම් - 19,000 | 4,575,200.00 |
| සුදු පාට වෙස්ට් - 2000 | 448,000.00 |
| දුඹුරු කැන්වස් ජෝඩු - 2808 | 3,594,240.00 |
| බුද්ධි ඒකකයේ නිලධාරීන්ට නිල උපකරණ | 90,385.00 |
| ටෝල් බූට්ස් 80/ හම් පාවහන් 66 | 417,978.60 |

| | |
|---|---|
| කාන්තා නිලධාරීන්ට පාවහන් | 11,189,659.60 |
| ජේ. මා. නිල පාවහන් | 577,530.00 |
| ජේ. මා. නිල ඇඳුම් | 280,500.00 |
| ඖෂධ සංයෝජක නිල ඇඳුම් | 56,000.00 |
| හිස්වැසුම් | 491,250.00 |
| ආයතන සඳහා | 1,176,795.58 |
| **එකතුව** | **42,760,125.78** |

**ඇමුණුම - 02**

**යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තුව හා වැඩිදියුණු කරීම් - 2002**

| කාර්යය | ආයතනය | වියදම |
|---|---|---|
| විවීන් යන්ත්‍රය සඳහා අමතර කොටස් | වැලිකඩ කර්මාන්ත අංශය | 46,900.00 |
| වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියාව | මාතර | 46,014.14 |
| වාෂ්ප කල්දේරම් 4ක් ගලවා ඉවත් කිරීම | වැලිකඩ | 71,971.20 |
| වතුර මෝටර් අළුත්වැඩියාව | වැලිකඩ | 11,700.00 |
| කාන්තා අංශ යකඩ සේප්පුව අළුත්වැඩියාව | වැලිකඩ | 35,327.04 |
| වතුර මෝටර් අළුත්වැඩියාව | කුරුවිට | 45,931.00 |
| වතුර මෝටර් 02ක් අළුත්වැඩියාව | වටරැක | 14,619.00 |
| බිම් තරාදිය අළුත්වැඩියාව | තංගල්ල | 18,275.00 |
| වතුර මෝටරය අළුත්වැඩියාව | අනුරාධපුර | 18,950.00 |
| වාෂ්ප බොයිලේරු 02ක් අළුත්වැඩියාව | වැලිකඩ | 331,296.00 |
| වාෂ්ප බොයිලේරු සඳහා ජල සැපයුම් | වැලිකඩ | 296,342.00 |
| විදුලි පොල් ගාන යන්ත්‍ර අළුත්වැඩියාව | වටරැක | 15,910.00 |
| විදුලි ජනක යන්ත්‍ර අළුත්වැඩියාව | මහර | 232,400.00 |
| වතුර මෝටර් 02ක් අළුත්වැඩියාව | මහර | 62,161.00 |
| බිම් තරාදිය අළුත්වැඩියාව | මහර | 15,293.00 |
| කොහු මෝල් යන්ත්‍ර 07ක් අළුත්වැඩියාව | දළුපොත | 36,750.00 |
| ඉන්ධන බොයිලේරු වාෂ්ප නල අළුත්වැඩියාව | මහර | 48,099.16 |

| | | |
|---|---|---|
| කල්දේරම් අළුත්වැඩියාව | වැලිකඩ | 421,800.00 |
| වතුර මෝටරය අළුත්වැඩියාව | වාරියපොළ | 17,261.00 |
| විදුලි පොල් ගාන යන්ත්‍ර අළුත්වැඩියාව | වැලිකඩ | 11,725.00 |
| වාෂ්ප බොයිලේරුව අළුත්වැඩියාව | වැලිකඩ | 19,992.00 |
| මිරිස් කොටන යන්ත්‍රය අළුත්වැඩියාව | වැලිකඩ | 39,428.57 |
| වතුර මෝටරය අළුත්වැඩියාව | කළුතර | 73,739.00 |
| වතුර මෝටරය අළුත්වැඩියාව | මහර | 7,014.00 |
| බිම ඔප දැමීමේ යන්ත්‍රය අළුත්වැඩියාව | බන්ධනාගාර මූලස්ථානය | 12,480.93 |
| බිම ඔප දැමීමේ යන්ත්‍රය අළුත්වැඩියාව | බන්ධනාගාර මූලස්ථානය | 500.00 |
| ෆැක්ස් යන්ත්‍රය අළුත්වැඩියාව | බන්ධනාගාර මූලස්ථානය | 18,284.00 |
| වෙනත් (බන්ධනාගාර ආයතනයන්හි සෘජු වියදම්) | | 416,891.47 |
| **මුළු එකතුව** | | **2,387,054.51** |

**ඇමුණුම - 03**

**ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම - 2102**

| විස්තරය | ලබාදුන් ආයතනය/පුද්ගලයා | මුදල |
|---|---|---|
| **ගෘහ භාණ්ඩ** | | **1,835,009.97** |
| විධායක පුටු 01 | බන්ධනාගාර අධිකාරී (සුභසාධක) - මූලස්ථාන | 9,800.00 |
| කුඩා මුදල් සේප්පුවක් | බන්ධනාගාර කොමසාරිස් (මුදල්) | 3,136.00 |
| වැකුම් ක්ලීනර් 01 | බන්ධනාගාර කොමසාරිස් ජනරාල් කාර්යාලය | 16,500.00 |
| කර්මාන්ත බිල් නිරවුල් කිරීම (1) | බන්ධනාගාර මූලස්ථානය | 229,055.00 |
| වතුර ෆිල්ටර් | බන්ධනාගාර කොමසාරිස් ජනරාල් කාර්යාලය | 6,750.00 |
| වායු සමීකරණ යන්ත්‍ර 01 | බන්ධනාගාර කොමසාරිස් පාලන 11 | 112,760.00 |
| ඡායා පිටපත් යන්ත්‍ර 2, ප්‍රින්ටර් 02, ස්කෑන් යන්ත්‍ර 02 | මූලස්ථානය (ආයතන/ගිණුම්) | 289,632.00 |
| ගුවන් විදුලි යන්ත්‍ර 01 | බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - නිල නිවස | 5,990.00 |
| බෝජනාගාර පුටු 64 | ප. වි. පු. ම. | 49,914.88 |
| ෆැක්ස් යන්ත්‍රයට කොටස් මිළදී ගැනීම. | බන්ධනාගාර මූලස්ථානය | 6,500.00 |

| | | |
|---|---|---|
| ෆෝම් මෙට්ට 1 | මැගසින් බන්ධනාගාරය | 4,675.00 |
| වෙනත් (බන්ධනාගාර ආයතනයන්හි සෘජු වියදම්) | | 1,100,297.09 |
| **ආරක්ෂක උපකරණ** | | **1,957,300.48** |
| පුද්ගලයන් පරීක්ෂා කිරීමේ උපකරණ 22 | බන්ධනාගාර ආයතන සඳහා | 1,897,280.00 |
| නිල මුගුරු 50 ක් නිෂ්පාදනය හා ඔප දැමීම | කෑගල්ල බන්ධනාගාරය | 12,880.47 |
| වෙනත් (බන්ධනාගාර ආයතනයන්හි සෘජු වියදම්) | | 47,140.01 |
| **තොරතුරු තාක්ෂණික උපකරණ** | | **9,974,138.41** |
| මල්ටි මීඩියා යන්ත්‍ර | ප. වි. පු. ම. | 65,000.00 |
| දුරකථන පද්ධතියට පරිගණකයක් | බන්ධනාගාර මූලස්ථානය | 57,375.00 |
| වේලා සටහන් යන්ත්‍ර | බන්ධනාගාර මූලස්ථානය | 1,133,200.00 |
| පරිගණක යන්ත්‍ර | බන්ධනාගාර මූලස්ථානය | 6,183,000.00 |
| ලේසර් ප්‍රින්ටර් | බන්ධනාගාර මූලස්ථානය | 435,000.00 |
| යූ. පී. එස්. | බන්ධනාගාර මූලස්ථානය | 286,440.00 |
| පරිගණක ප්‍රින්ටර් | බන්ධනාගාර මූලස්ථානය | 770,000.00 |
| වෛරස් ගාඩ් | බන්ධනාගාර මූලස්ථානය | 12,050.00 |
| වෙනත් | | 1,032,073.41 |
| **මුළු එකතුව** | | **13,766,448.86** |

**ඇමුණුම - 04**

**යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් - 2103**

| විස්තරය | ලබාදුන් ආයතනය/පුද්ගලයා | මුදල |
|---|---|---|
| ඩී.වී.ඩී. යන්ත්‍ර | බන්ධනාගාර මුලස්ථානය | 6,295.00 |
| පුවත්පත් දැන්වීම් සඳහා (1) | බන්ධනාගාර මුලස්ථානය | 78,400.00 |
| පොල් ලෙලි තලන යන්ත්‍රය සඳහා 80% | පල්ලන්සේන | 500,000.00 |
| වතුර මෝටර් 1 | බන්ධනාගාර මුලස්ථානය (බුද්ධි හා ආරක්ෂක ඒකකය) | 13,900.00 |
| බහු කාර්ය වඩු යන්ත්‍ර | වැලිකඩ බන්ධනාගාරය | 144,500.00 |
| පුවත්පත් දැන්වීම සඳහා (2) | බන්ධනාගාර මුලස්ථානය | 78,400.00 |
| විදුලි ජනක යන්ත්‍ර | බන්ධනාගාර මුලස්ථානය | 2,869,264.00 |

| | | |
|---|---|---|
| වායු සමීකරණ යන්ත්‍ර | බන්ධනාගාර මූලස්ථානය (ආයතන අංශය, Sever Room) | 773,100.00 |
| සාස්පාන් සහ කල්දේරම් | බූස්ස බන්ධනාගාරය | 227,500.00 |
| **එකතුව** | | **4,691,359.00** |
| උක්ත වැය විෂය යටතේ විවිධ බන්ධනාගාර ආයතන වලින් කරනු ලබන ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් 2012 වර්ෂය සඳහා පහත භාණ්ඩ හා සේවා මිලදී ගැනීම | | |
| ඩීසල් වතුර මෝටරයක් | අනුරාධපුර | 81,510.00 |
| ටයිල් කටර් 01 | පල්ලන්සේන | 5,900.00 |
| පෑස්සුම් යන්ත්‍ර 01 | මැගසින් | 15,250.00 |
| මිරිස් අඹරන යන්ත්‍ර 01 | කුරුවිට | 65,000.00 |
| පොල් මිරිකන යන්ත්‍ර 02 | වැලිකඩ | 179,000.00 |
| පොල් මිරිකන යන්ත්‍ර 01 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | 89,500.00 |
| වතුර මෝටර 01 | වාරියපොළ | 16,171.00 |
| උදළු තල 30 | දළුපොත | 22,500.00 |
| උදළු තල 45 | තල්දෙන | 41,375.00 |
| විදුලි පොල් ගාන යන්ත්‍ර 2ක් ලබාගැනීම සඳහා අමතර ප්‍රතිපාදන | වැලිකඩ | 12,490.00 |
| මහල් නිවාස අළුත්වැඩියා සඳහා උපකරණ | වැලිකඩ | 63,735.00 |
| ටී.අයි.ජී.වෙල්ඩින් යන්ත්‍ර | වැලිකඩ කර්මාන්ත අංශය | 99,353.00 |
| උදළු තල 40 | වාරියපොළ | 37,200.00 |
| කම්හල් අංශයට උපකරණ | දළුපොත | 17,175.00 |
| හේස්ප්‍රේ දියර ඉසින යන්ත්‍ර 01 | තල්දෙන | 11,490.00 |
| සෙන්ට්‍රික් වතුර මෝටර 01 | තල්දෙන | 24,200.00 |
| වඩු අංශයට උපකරණ | දළුපොත | 62,270.00 |
| පේෂකර්ම අංශයට අවශ්‍ය උපාංග | දළුපොත | 31,400.00 |
| වඩු අංශයට අවශ්‍ය උපකරණ | මහර | 12,560.00 |
| ඈන්ගල් ග්‍රයින්ඩර් 01 | මැගසින් | 14,950.00 |
| විදුලි පොල් ගාන යන්ත්‍ර (2) | කෑගල්ල | 29,940.00 |

| | | |
|---|---|---|
| වීවින් යන්ත්‍ර අමතර කොටස් | වැලිකඩ | 51,025.00 |
| අත් යන්ත්‍ර අමතර කොටස් | වැලිකඩ | 34,400.00 |
| පොල් ලෙලි තලන යන්ත්‍ර 01 | දළුපොත | 495,000.00 |
| කොහු ඉදල් මිට සකසන යන්ත්‍ර | දළුපොත | 85,000.00 |
| කොහු තලන යන්ත්‍ර | දළුපොත | 45,000.00 |
| පොල් ලෙලි තලන යන්ත්‍රය සඳහා 20% | දළුපොත | 125,000.00 |
| හේස්ප්‍රේ දියර ඉසින යන්ත්‍ර 1 | මැගසින් | 12,650.00 |
| වෙනත් | | 242,527.34 |
| **එකතුව** | | **2,023,571.34** |
| **මුළු එකතුව** | | **6,714,930.34** |

## සුභසාධක අංශය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු අනුව යමින් සිරගතවන්නන් නිදහස් වන විට යහපත් පුරවැසියන් ලෙස සමාජයට අනුගත කිරීමේ ක්‍රමවත් සුභසාධන වැඩපිළිවෙලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අංශය මඟින් ක්‍රියාත්මක කෙරේ. මෙම අංශයේ 2012.01.01 සිට 2012.12.31 දක්වා කාර්ය සාධනය පහත පරිදි වේ.

### 01. ආයතනික පොදු වැඩසටහන්

(මෙම වැඩසටහන් ආයතන වල පොදුවේ ක්‍රියාත්මක වන ඒවා බැවින් සාමාන්‍යයෙන් සියළු නේවාසික පිරිස් සහභාගී වනු ලබයි.)

#### 01.1 අධ්‍යාත්මික හා ආගමික කටයුතු

පසළොස්වක පොහොය දින වලදී පැවැත්වෙන ශීල ව්‍යාපාර, ධර්ම දේශනා, භාවනා වැඩසටහන්, ඇතුළු සියළුම බෞද්ධ වැඩසටහන්, හින්දු ආගමික කටයුතු හා සියළු වැඩසටහන්, මුස්ලිම් ආගමික කටයුතු හා සියළු වැඩසටහන්, කතෝලික ආගමික කටයුතු හා සියළු වැඩසටහන්, මානසික සංවර්ධන හා උපදේශන වැඩසටහන් යනාදී වූ වැඩසටහන් 2956 ක් පවත්වා ඇත. ඒ සඳහා රැඳවියන් 61446 දෙනෙක් සහභාගිවූ අතර ඒ සඳහා රු. 506,900.50 ක මුදලක් වැයවී ඇත.

#### 01.2 අධ්‍යාපන හා සුභසාධන කටයුතු

සාක්ෂරතා වැඩසටහන්, වෘත්තිය පුහුණු කටයුතු, පරිගණක පුහුණුව, පුස්තකාල කටයුතු, දහම් අධ්‍යාපනය, සංස්කෘතික කටයුතු, සෞඛ්‍ය වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාර වැඩසටහන්, නේවාසික පවුල් හමු යනාදී වූ වැඩසටහන් 6293 ක් පවත්වා ඇත. මෙම වැඩසටහන් රැඳවියන් 72795 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් සිදුකල අතර ඒ සඳහා රුපියල් රු. 390,040.50 ක වියදමක් දරා ඇත.

#### 01.3 ක්‍රීඩා හා වෙනත් පහසුකම්

ක්‍රීඩා භාණ්ඩ ලබා ගැනිම, අන්තර් බන්ධනාගාර වොලිබෝල්/ක්‍රිකට් සහ වෙනත් තරඟ ඇතුළුව තරඟාවලි 720 ක් පමණ පැවැත් වූ අතර ඒ සඳහා රුපියල් 396,858.80 ක පමණ වියදමක් දරා ඇත. සහභාගිවූ රැඳවියන් සංඛ්‍යාව 20493කි.

#### 01.4 ත්‍යාග දීම

විශේෂ කුසලතා දක්වන නේවාසිකයින් ඇගයීම, විශේෂිත දින වෙනුවෙන් පවත් වන තරඟාවලින් සඳහා ත්‍යාග ප්‍රදානය (නිදහස් දිනය, අවුරුදු උත්සවය, සාක්ෂරතා දිනය, සිරකරු දිනය, මත්ද්‍රව්‍ය නිවාරණ දිනය යනාදී..) සඳහා වැඩසටහන් 78 ක් මෙම කාලය තුළ පැවැත්වූ අතර ඒ සඳහා නේවාසිකයින් 954 දෙනෙක් පමණ සහභාගි විය. වැය වූ මුදල රුපියල් 183,600.50 කි.

### 01.5 පශ්චාත්භාර සේවා කටයුතු

නිදහස් වන සිරකරුවන්ට වෘත්තිය ආධාර ලබා දීම, පසුහාර කමිටු රැස්වීම් යනාදී වූ වැඩසටහන් 19 ක් පමණ පැවැත්වූ අතර ඒ සඳහා නේවාසිකයින් 194 දෙනෙක් සහභාගි විය.

### 01.6 සමාජ ගත කිරීම

- බලපත්‍ර මත මුදාහැරීම - 130

## 02. සිරකරු සුභසාධක අංශයේ ඉපැයීම් (2012.01.01 දින සිට 2012.12.31 දක්වා)

### 02.1 නැටුම් කණ්ඩායමට අදාළ ඉපැයීම් (වැලිකඩ, මහර, බෝගම්බර)

| මාසය | උපයා ඇති මුළු මුදල රු. | නැටුම් ශිල්පීන්ට ගෙවූ මුදල රු. (25%) | රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ මුදල රු. (10%) | සිරකරු සුභසාධක අරමුදලට බැර කළ මුදල රු. (40%) | නැටුම් උපදේශකට ගෙවූ මුදල (25%) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 81,300.00 | 20,325.00 | 8,130.00 | 32,520.00 | 20,325.00 |
| පෙබරවාරි | 14,400.00 | 3,600.00 | 1,440.00 | 5,760.00 | 3,600.00 |
| මාර්තු | 67,000.00 | 16,750.00 | 6,700.00 | 26,800.00 | 16,750.00 |
| අප්‍රේල් | 58,400.00 | 14,600.00 | 5,840.00 | 23,360.00 | 14,600.00 |
| මැයි | 20,400.00 | 5,100.00 | 2,040.00 | 8,160.00 | 5,100.00 |
| ජුනි | 67,500.00 | 16,875.00 | 6,750.00 | 27,000.00 | 16,875.00 |
| ජූලි | 86,200.00 | 21,550.00 | 8,620.00 | 34,480.00 | 21,550.00 |
| අගෝස්තු | 96,300.00 | 24,075.00 | 9,630.00 | 38,520.00 | 24,075.00 |
| සැප්තැම්බර් | 63,200.00 | 15,800.00 | 6,320.00 | 25,280.00 | 15,800.00 |
| ඔක්තෝබර් | 96,600.00 | 24,150.00 | 9,660.00 | 38,640.00 | 24,150.00 |
| නොවැම්බර් | 71,400.00 | 17,850.00 | 7,140.00 | 28,560.00 | 17,850.00 |
| දෙසැම්බර් | 104,200.00 | 26,050.00 | 10,420.00 | 41,680.00 | 26,050.00 |
| **එකතුව** | **826,900.00** | **206,725.00** | **82,690.00** | **330,760.00** | **206,725.00** |

02..2 වැඩ සහන පදනම යටතේ කෙටි කාලීන වැඩ සඳහා ඉපැයීම (පල්ලේකැලේ, බදුල්ල, වැලිකඩ)

| මාසය | යෙදවූ සිරකරුවන් සංඛ්‍යාව | උපයා ඇති මුළු මුදල රු. | සිරකරුවන්ට ගෙවූ මුදල රු. (70%) | රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ මුදල රු. (10%) | සිරකරු සුභසාධක අරමුදලට බැර කළ මුදල රු. (10%) | නිලධාරි ත්‍යාග අරමුදලට ගෙවීම රු. (10%) |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 627 | 180,800.00 | 126,560.00 | 18,080.00 | 18,080.00 | 18,080.00 |
| පෙබරවාරි | 775 | 253,800.00 | 177,660.00 | 25,380.00 | 25,380.00 | 25,380.00 |
| මාර්තු | 790 | 252,200.00 | 176,540.00 | 25,220.00 | 25,220.00 | 25,220.00 |
| අප්‍රේල් | 321 | 92,700.00 | 64,890.00 | 9,270.00 | 9,270.00 | 9,270.00 |
| මැයි | 561 | 159,100.00 | 111,370.00 | 15,910.00 | 15,910.00 | 15,910.00 |
| ජුනි | 749 | 220,700.00 | 154,490.00 | 22,070.00 | 22,070.00 | 22,070.00 |
| ජූලි | 501 | 100,200.00 | 70,140.00 | 10,020.00 | 10,020.00 | 10,020.00 |
| අගෝස්තු | 666 | 184,000.00 | 128,800.00 | 18,400.00 | 18,400.00 | 18,400.00 |
| සැප්තැම්බර් | 687 | 186,900.00 | 130,830.00 | 18,690.00 | 18,690.00 | 18,690.00 |
| ඔක්තෝබර් | 606 | 17,600.00 | 12,320.00 | 1,760.00 | 1,760.00 | 1,760.00 |
| නොවැම්බර් | 612 | 170,800.00 | 119,560.00 | 17,080.00 | 17,080.00 | 17,080.00 |
| දෙසැම්බර් | 1731 | 448,300.00 | 313,810.00 | 44,830.00 | 44,830.00 | 44,830.00 |
| **එකතුව** | **8626** | **2,267,100.00** | **1,586,970.00** | **226,710.00** | **226,710.00** | **226,710.00** |

02.3 වැඩ සහන පදනම යටතේ දීර්ඝ කාලීන වැඩ සඳහා ඉපැයීම (වැලිකඩ, මහර, බෝගම්බර)

| මාසය | යෙදවූ සිරකරුවන් සංඛ්‍යාව | උපයා ඇති මුළු මුදල රු. | සිරකරුවන්ට ගෙවූ මුදල රු. (80%) | රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ මුදල රු. (10%) | සිරකරු සුභසාධක අරමුදලට බැර කළ මුදල රු. (10%) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 168 | 390,430.00 | 312,344.00 | 39,043.00 | 39,043.00 |
| පෙබරවාරි | 148 | 305,065.00 | 244,052.00 | 30,506.50 | 30,506.50 |
| මාර්තු | 143 | 250,270.00 | 200,216.00 | 25,027.00 | 25,027.00 |
| අප්‍රේල් | 218 | 184,750.00 | 147,800.00 | 18,475.00 | 18,475.00 |
| මැයි | 332 | 254,160.00 | 203,328.00 | 25,416.00 | 25,416.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ජුනි | 331 | 256,770.00 | 205,416.00 | 25,677.00 | 25,677.00 |
| ජූලි | 272 | 253,590.00 | 202,872.00 | 25,359.00 | 25,359.00 |
| අගෝස්තු | 214 | 205,370.00 | 164,296.00 | 20,537.00 | 20,537.00 |
| සැප්තැම්බර් | 240 | 210,270.00 | 168,216.00 | 21,027.00 | 21,027.00 |
| ඔක්තෝබර් | 251 | 238,190.00 | 190,552.00 | 23,819.00 | 23,819.00 |
| නොවැම්බර් | 326 | 190,720.00 | 152,576.00 | 19,072.00 | 19,072.00 |
| දෙසැම්බර් | 238 | 144,160.00 | 115,328.00 | 14,416.00 | 14,416.00 |
| **එකතුව** | **2881** | **2,883,745.00** | **2,306,996.00** | **288,374.50** | **288,374.50** |

## 03. විශේෂ වැඩසටහන්

### 03.1 සියළුම බන්ධනාගාර ආයතන

- නිදහස් දිනය, තෛපොන්ගල් උත්සවය, සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය, වෙසක් හා පොසොන් දින, රාමසාන් උත්සවය, මත්ද්‍රව්‍ය විරෝධී දිනය ඇතුළු විශේෂ අවස්ථා උත්කර්ෂවත් අයුරින් සැමරීම.
- සැප්තැම්බර් 12 වන දිනට යෙදෙන සිරකරු සුභසාධක දිනයට සමගාමීව ජනවාරි සිට අගෝස්තු දක්වා ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩ සටහන්.
  - සෞඛ්‍ය (ජනවාරි)
  - නීති ආධාර හා නිදහස් දින සැමරුම (පෙබරවාරි)
  - අධ්‍යාපන (මාර්තු)
  - සංස්කෘතික (අප්‍රේල්)
  - ආගමික (මැයි)
  - වෘත්තිය පුහුණු (ජුනි)
  - ක්‍රීඩා(ජූලි)
  - ශ්‍රමදාන කටයුතු(අගෝස්තු)
  - පවුල් හමුව (සැප්තැම්බර්)

- මැයි මස 09 වන දින ලෝක මව්වරුන්ගේ දිනය උත්කර්ෂවත් අයුරින් සැමරීම. (ප්‍රධාන උත්සවය - වැලිකඩ කාන්තා අංශයේදී පැවැත්වින.)
- ජුනි මස 19 වන දින ලෝක පියවරුන්ගේ දිනය උත්කර්ෂවත් අයුරින් සැමරීම. (ප්‍රධාන උත්සවය මහර බන්ධනාගාරයේදී පැවැත්විණ.)
- සැප්තැම්බර් 12 වන දිනට යෙදුන සිරකරු දින උළෙල හා නේවාසික අත්කම් භාණ්ඩ ප්‍රදර්ශනය උත්කර්ෂවත් අයුරින් 2012.09.30 වන දින බොරැල්ල කැම්බල් පිටියේදී පැවැත්**විණ**. මෙහිදී වෘත්තීය පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කළ නේවාසිකයින් 910 දෙනෙකු සඳහා සහතික පත් පිරිනැමීමත්, නිදහස් වීමට ආසන්න නේවාසිකයන් 20 දෙනෙකුට වඩු කට්ටල 10ක්, පෙදරේරු

කට්ටල 10ක් පිරිනැමීමත්, චිත්‍ර, ගද්‍ය හා පද්‍ය තරඟවලින් ජයග්‍රහණය කරන ලද නේවාසිකයින් 09 දෙනෙකුට සහතික පත්‍ර පදානය කිරීමත් සිදුකෙරිණි.

- 2012.11.13 වන දිනට යෙදුන දීපවාලී දිනය උත්කර්ෂවත් අයුරින් සැමරීම.
- 2012.12.10 දින සිට 17 වන දින දක්වා සෞඛ්‍ය සතියට සමගාමීව සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- නත්තල් දින සැමරුම් වැඩසටහන් පැවැත්වීම.
- 2013 නව වසර වෙනුවෙන් සර්ව ආගමික ආශිර්වාද වැඩසටහන් පැවැත්වීම.

## 03.2 වැලිකඩ බන්ධනාගාරය

- අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් අධ්‍යාපන ඒකකයේ අනුග්‍රහයෙන් නේවාසිකයින් 40 දෙනෙක් සඳහා විවෘත පාසැලක් ආරම්භ කිරීම.
- වෙසක් තොරණ සඳහා කප් සිටුවීමේ උළෙල බන්ධනාගාර කොමසාරිස් ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් වැලිකඩ බන්ධනාගාරය ඉදිරිපිටදී සිදුකරීම.
- වෙසක් උත්සවය නිමිත්තෙන් නිලධාරින් හා රැඳවියන්ගෙන් සමන්විත කණ්ඩායමක් මැයි මස 05වන දින සිට 08වන දින දක්වා භක්ති ගීත ගායනයන් ඉදිරිපත් කිරීම. (වැලිකඩ බන්ධනාගාරය හා පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය ඉදිරිපිටදී)
- ජූනි 04, 05 දිනයන්හිදී පොසොන් උත්සවය නිමිත්තෙන් එම භක්ති ගීත කණ්ඩායම මාතර බන්ධනාගාරය ආශ්‍රිතව පැවැති පොසොන් කලාපය සඳහා සහභාගි කරවීම.
- ජූලි 06 වන දින කොමර්ෂල් බැංකුවේ හා සෞඛ්‍ය අමාත්‍යංශයේ අනුග්‍රහයෙන් පරිගණක ඒකකයක් හා දන්ත ශල්‍යාගාරයක් විවෘත කිරීම. මේ සඳහා රැඳවියන් 100ක් සහභාගි විය.

### 03.2.1. වැලිකඩ බන්ධනාගාරය (කාන්තා අංශය)

- ගරු ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂ මැතිනියගේ ප්‍රධානත්වයෙන් කාන්තා දින සැමරුම් උළෙල මාර්තු 08 වන දින උත්කර්ෂවත් අයුරින් පැවැත්වීම.

## 03.3 තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය - අඹේපුස්ස

- 2012 වර්ෂය සඳහා නේවාසිකයින් 15 දෙනෙක් සඳහා අ.පො.ස (සා.පෙළ) පංති ආරම්භ කිරීම.
- නේවාසිකයින් 08 දෙනෙක් සඳහා අ.පො.ස (සා.පෙළ) සෞන්දර්ය විෂයෙහි ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වීම.
- 2012.12.02 වන දින රැඳවියන් 33 දෙනෙක් සඳහා දහම් පාසල් අවසාන විභාගය පැවැත්වීම.

## 03.4 මාතර රිමාන්ඩ් බන්ධනාගාරය

- ජූනි මස 04, 05 දිනයන්හිදී පොසොන් උත්සවය නිමිත්තෙන් මාතර උයන්වත්ත ක්‍රීඩාංගනයේ පොසොන් කලාපයක් නිර්මාණය කිරීම.

### 03.5 බෝගම්බර බන්ධනාගාරය

- සිරකරු දිනය වෙනුවෙන් පැවති පවුල් හමු වැඩසටහනෙහි ප්‍රධාන උත්සවය පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2012.10.01 වන දින පැවැත්විණ.

### 03.6 අනුරාධපුරය බන්ධනාගාරය

- 2012.09.22 වන දින ජාතික සාම දිනය උත්කර්ෂවත් අයුරින් සැමරීම.

### 03.7 මහර බන්ධනාගාරය

- 2012.10.01 දිනට යෙදුන ලෝක ළමා දිනය වෙනුවෙන් ප්‍රධාන උත්සවය පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීම.

### 03.8 ගාල්ල රිමාන්ඩ් බන්ධනාගාරය

- 2012.12.02 වන දින රැඳවියන් 50 දෙනෙක් සඳහා දහම් පාසල් අවසාන විභාගය පැවැත්වීම.

## 04. බාහිර රාජ්‍ය ආයතන හා ඒකාබද්ධව නේවාසිකයින් සඳහා ක්‍රියාත්මක කරන ලද පුහුණු පාඨමාලා

### 04.1 වෘත්තිය පුහුණු අධිකාරිය (තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය)

| පාඨමාලාව | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| වඩු | දළුපොත | අවු. 01 | 12 | 120 | වෘත්තිය නිපුණතාවයක් හා NVQ සහතිකයක් ලබාදීම. |
| | කුරුවිට | මාස 06 | 04 | 58 | |
| | පල්ලෙකැලේ | අවු. 01 | 10 | 135 | |
| වෙල්ඩින් | දළුපොත | අවු. 01 | 12 | 135 | |
| | බූස්ස | අවු. 01 | 08 | 139 | |
| | බෝගම්බර | අවු. 01 | 12 | 168 | |
| | වීරවිල | මාස 06 | 06 | 126 | |
| | පල්ලෙකැලේ | අවු. 01 | 12 | 134 | |
| ඇලුමිනියම් | දළුපොත | අවු. 01 | 12 | 135 | |
| ස්වර්ණාභරණ | | අවු. 01 | 12 | 135 | |
| පෙදරේරු | බදුල්ල | අවු. 01 | 12 | 108 | |
| | අනුරාධපුරය | මාස 06 | 06 | 120 | |
| | පොළොන්නරුව | අවු. 01 | 12 | 128 | |
| | පල්ලෙකැලේ | අවු. 01 | 12 | 140 | |
| ඉංග්‍රීසි භාෂා | | අවු. 01 | 12 | 315 | ඉංග්‍රීසි භාෂා දැනුම |
| උද්‍යාන අලංකරණ | අනුරාධපුරය | අවු. 01 | 12 | 96 | වෘත්. නිපුණතාවයක් ලබාදීම |
| සම් පාවහන් නිෂ්. | | මාස 06 | 02 | 20 | පුහුණුවක් හා සහතිකයක් |
| තිර රෙදි මුද්‍රණ | කළුතර | අවු. 01 | 12 | 115 | පුහුණුවක් හා සහතිකයක් |
| මෝටර් කාර්මික | අඹේපුස්ස | අවු. 01 | 12 | 141 | වෘත්. නිපුණතාවයක් ලබාදීම |
| අධිවේගී මැහුම් | මොණරාගල | අවු. 01 | 30 | 160 | වෘත්තිය නිපුණතාවයක් හා NVQ සහතිකයක් ලබාදීම. |
| කොණ්ඩා කැපීම | වැලිකඩ (කාන්තා) | අවු. 01 | 12 | 105 | |
| සම්භාණ්ඩ නිෂ්. | බූස්ස | අවු. 01 | 12 | 162 | |
| ජුකී මැහුම් | | අවු. 01 | 12 | 137 | |
| විදුලි ශිල්පී | ගාල්ල | මාස 06 | 06 | 85 | |
| මැහුම් පාඨමාලාව (කාන්තා) | | මාස 06 | 07 | 118 | |

## 04.2 ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය)

| පාඨමාලාව | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| කොහු ආශ්‍රිත පුහුණු | දළුපොත | මාස 06 | 10 | 72 | වෘත්තිය නිපුණතාවයක් ලබාදීම |
| මැහුම් පාඨමාලාව | | මාස 06 | 06 | 10 | |
| | කුරුවිට | මාස 06 | 10 | 120 | |
| | මහර | මාස 06 | 06 | 120 | |
| | වීරවිල | මාස 06 | 06 | 96 | |
| | තංගල්ල | අවු. 01 | 12 | 98 | පුහුණුවක් හා සහතිකයක් |
| විදුලි කාර්මික | මොණරාගල | මාස 09 | 25 | 140 | පිළිගත් සහතිකයක් |
| | කුරුවිට | මාස 06 | 09 | 93 | පුහුණුවක් හා සහතිකයක් |
| ජලනල හා කාර්මික පාඨමාලාව | වටරැක | පැය 200 | 60 | 117 | වෘත්තිය නිපුණතාවයක් හා NVQ සහතිකයක් ලබාදීම. |
| | අඹේපුස්ස | මාස 06 | 12 | 56 | |
| පෙදරේරු | | මාස 06 | 08 | 56 | |
| ගෘහස්ථ විදුලි කාර්මික | අඹේපුස්ස | අවු. 01 | 12 | 84 | |
| පරිඝණක | අඹේපුස්ස | පැය 30 | 15 | 120 | |
| වඩු පුහුණු | | අවු. 01 | 12 | 104 | |

## 04.3 නොවිධිමත් අධ්‍යාපන ඒකකය (අධ්‍යාපන අමාත්‍යාංශය)

| පාඨමාලාව | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| සාක්ෂරතා පංති | දළුපොත | අවු. 01 | 12 | 175 | සාක්ෂරතා හැකියාව දියුණු කිරීම |
| | කුරුවිට | අවු. 01 | 15 | 303 | |
| | බූස්ස | අවු. 01 | 12 | 134 | |
| | තල්දෙන | මාස 06 | 07 | 125 | |
| | ගාල්ල | මාස 08 | 27 | 142 | |
| | වැලිකඩ | අවු. 01 | 34 | 245 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වැලිකඩ (කාන්තා) | අවු. 01 | 12 | 280 | |
| | උඹේපුස්ස | අවු. 01 | 12 | 266 | |
| | බෝගම්බර | මාස 10 | 10 | 210 | |
| | ඹහර | මාස 08 | 08 | 175 | |
| | වාරියපොල | මාස 06 | 07 | 140 | |
| | කෑගල්ල | වර්ෂය පුරා | 48 | 90 | |
| | පල්ලෙකැලේ | අවු. 01 | 12 | 105 | |
| | කළුතර | අවු. 01 | 15 | 140 | |
| ගෘහස්ථ විදුලි රැහැන් ඇදීමේ පාඨමාලාව | තල්දෙන | මාස 06 | 24 | 75 | පුහුණුවක් හා සහතිකයක් |
| | බූස්ස | මාස 08 | 06 | 60 | පුහුණුවක් හා සහතිකයක් |
| මැහුම් පාඨමාලාව | වාරියපොළ | මාස 08 | 08 | 84 | විධිමත් පුහුණුවක් |
| | මීගමුව | මාස 04 | 16 | 40 | |
| සූප ශාස්ත්‍ර පාඨමාලාව | වැලිකඩ (කාන්තා) | අවු. 01 | 12 | 280 | |
| රෙදි පින්තාරු | මොණරාගල | මාස 06 | 06 | 20 | |
| අත්කම් නිර්මාණ (කාන්තා) | තංගල්ල | අවු. 01 | 12 | 70 | |
| | ගාල්ල | මාස 08 | 08 | 50 | |
| | බදුල්ල | මාස 06 | 08 | 75 | ස්වයං රැකියාවකට පුහුණුවක් |
| ජේන්ද හා වූල් ගෙතීම (කාන්තා) | ගාල්ල | මාස 08 | 08 | 45 | විධිමත් පුහුණුවක් |
| සංගීත (වාදන) | | මාස 08 | 08 | 63 | සංස්. හැකියාවන් දියුණු කිරීම |
| බතික් පාඨමාලාව | බූස්ස | මාස 08 | 08 | 60 | පුහුණුවක් හා සහතිකයක් |
| පහතරට නැටුම් | | මාස 08 | 08 | 48 | සංස්. හැකියාවන් දියුණු කිරීම |

## 04.4 ජාතික තරුණ සේවා සභාව

<table>
<tr><th>පාඨමාලාව</th><th>බන්ධනාගාරය</th><th>පාඨමාලා කාලය</th><th>පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව</th><th>ප්‍රතිලාභීන් සංඛ්‍යාව</th><th>රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ</th></tr>
<tr><td>වැද්දුම් ශිල්පය</td><td>මොණරාගල</td><td>මාස 06</td><td>06</td><td>20</td><td>පුහුණුවක් හා සහතිකයක්</td></tr>
<tr><td>නැටුම් පුහුණු පාඨමාලාව</td><td rowspan="2">අඹේපුස්ස</td><td>අවු. 01</td><td>12</td><td>210</td><td>සංස්. හැකියාවන් දියුණු කිරීම</td></tr>
<tr><td rowspan="2">නැටුම්, සංගීත පුහුණු පාඨමාලාව</td><td>මාස 06</td><td>06</td><td>15</td><td>සංස්. හැකියාවන් දියුණු කිරීම</td></tr>
<tr><td>තල්දෙන</td><td>මාස 06</td><td>06</td><td>60</td><td>පුහුණුවක් හා සහතිකයක්</td></tr>
</table>

## 04.5 ජාතික ශිල්ප සභාව

<table>
<tr><th>පාඨමාලාව</th><th>බන්ධනාගාරය</th><th>පාඨමාලා කාලය</th><th>පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව</th><th>ප්‍රතිලාභීන් සංඛ්‍යාව</th><th>රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ</th></tr>
<tr><td>පොල්කටු ආශ්‍රිත නිර්මාණ පාඨමාලාව</td><td>බදුල්ල</td><td>මාස 06</td><td>06</td><td>85</td><td>ස්වයං රැකියාවකට පුහුණුවක් හා සහතිකයක්</td></tr>
<tr><td>උණබට ආශ්‍රිත නිර්මාණ පාඨමාලාව</td><td>බෝගම්බර</td><td>අවු. 01</td><td>11</td><td>147</td><td rowspan="4">ස්වයං රැකියාවකට පුහුණුවක්</td></tr>
<tr><td>කෙසෙල් කෙඳි ආශ්‍රිත නිර්මාණ පාඨමාලාව</td><td>මහනුවර රිමාන්ඩ්</td><td>අවු. 01</td><td>06</td><td>140</td></tr>
<tr><td>අත්කම් නිර්මාණ</td><td>මහර</td><td>අවු. 01</td><td>07</td><td>105</td></tr>
<tr><td>තල් කොළ ආශ්‍රිත නිෂ්. පාඨමාලාව</td><td>අනුරාධපුරය</td><td>මාස 06</td><td>06</td><td>30</td></tr>
</table>

## 04.6 කාර්මික විද්‍යාලය, වීරවිල

| පාඨමාලාව | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| වඩු පුහුණු | වීරවිල | මාස 06 | 06 | 78 | ස්වයං රැකියාවකට පුහුණුවක් |

### 04.7 තල් සංවර්ධන මණ්ඩලය

| පාඨමාලාව | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| තල් කොළ ආශ්‍රිත අත්කම් භාණ්ඩ නිෂ්. පුහුණු පාඨමාලාව | වීරවිල | මාස 06 | 6 | 102 | ස්වයං රැකියාවකට පුහුණුවක් |
| | යාපනය | මාස 06 | 6 | 50 | |
| | අනුරාධපුරය | මාස 04 | 4 | 25 | |
| | මඩකලපුව | අවු. 01 | 8 | 48 | |

### 04.8 කජු සංස්ථාව

| පාඨමාලාව | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| කජු වගාව | යාපනය | අවු. 01 | 08 | 48 | ස්වයං රැකියාවකට පුහුණුවක් |
| | මඩකලපුව | බන්ධනාගාර ගොවිපළෙහි අක්කර 02 ක් පමණ වගා කිරීම | | | |

## 05. බාහිර රාජ්‍ය ආයතන හා ඒකාබද්ධව නේවාසිකයින් සඳහා ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්

### 05.1 ලිංගාශ්‍රිත රෝග මර්ධන ඒකකය

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| HIV/AIDS දැනුවත් කිරීමේ වැඩසටහන් | සියළු බන්ධ. | වර්ෂය පුරා | තෝරා ගත් නේවාසිකයින් සහචර නායකයින් ලෙස පුහුණු කර ඔවුන් මගින් අනෙකුත් සිරකරුවන් දැනුවත් කරීමට කටයුතු කරීම | | රෝග වළක්වා ගැනීම පිළිබඳ දැනුම |
| HIV/AIDS නිවාරණ වැඩසටහන් | කුරුවිට | අවු. 01 | 13 | 313 | |

05.2 **සෞඛ්‍ය අමාත්‍යාංශය/සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| මානසික සෞඛ්‍ය සායන | කළුතර | අවු. 01 | 32 | 99 | රෝග වළක්වා ගැනීම පිළිබඳ දැනුම |
| දන්ත සායන | | මාස 2 කට වරක් | 12 | 150 | |
| ක්ෂය රෝග මර්ධන වැඩසටහන් | කො.රි.බ | - | 09 | 550 | |
| | බෝගම්බර | වර්ෂය පුරා | 84 | අවශ්‍ය නේවාසිකයින් | |
| විශේෂඥ වෛද්‍ය සායන | ත්‍රිකුණාමලය | - | 02 | 50 | |
| ඩෙංගු රෝග මර්ධන වැඩසටහන් | පල්ලෙකැලේ | දින 01 | 01 | 155 | |

05.3 **මැලේරියා රෝග මර්ධන කාර්යාලය**

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| මැලේරියා මර්ධන වැඩසටහන | පල්ලෙකැලේ | දින 01 | 01 | 300 | රෝග වළක්වා ගැනීම පිළිබඳ දැනුම |

05.4 **දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| ආයුර්වේද සායන | පල්ලෙකැලේ | සෑම මසකම | 14 | 490 | රෝග වළක්වා ගැනීම පිළිබඳ දැනුම |
| | කළුතර | වසර පුරා | 12 | 280 | |

## 05.5 ළය රෝහල

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| ක්ෂය රෝග මර්ධන වැඩසටහන | වැලිකඩ | වසර පුරා | 13 | 635 | රෝග වළක්වා ගැනීම පිළිබඳ දැනුම |
| | පල්ලෙකැලේ | දින 01 | 1 | 200 | |

## 05.6 කුණ්ඩසාලේ ප්‍රාදේශිය සභාව

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| ජංගම පුස්තකාලය | පල්ලෙකැලේ | මා. 2 කට වරක් | 4 | 900 | දැනුම වර්ධනය වීම |

## 05.7 ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | පල්ලෙකැලේ | වර්ෂය පුරා | 7 | සියලු මත්ද්‍රව්‍ය. වැරදිකරුවන් | මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳව |
| | බෝගම්බර | වර්ෂය පුරා | 12 | 380 | දැනුවත් වීම |
| | නුවර රිමාන්ඩ් | වර්ෂය පුරා | 46 | සියලු මත්ද්‍රව්‍ය. වැරදිකරුවන් | |
| | කෑගල්ල | වර්ෂය පුරා | 34 | 150 | |
| | අනුරාධපුරය | දින 01 | 5 | 79 | |
| උපදේශන වැඩසටහන් | කළුතර | අවු. 01 | 12 | 525 | ආකල්ප වර්ධනය |
| | අඹේපුස්ස | අවු. 01 | 84 | සියලු නේවාසිකයින් | |

05.8 **සමාජ සේවා අමාත්‍යාංශය**

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| උපදේශන වැඩසටහන | කුරුවිට | අවු. 01 | 12 | 137 | ගැටලු විසඳා ගැනීමට හැකිවීම |
| | අනුරාධපුරය | දීර්ඝ කාලීන | 18 | 119 | |
| | බෝගම්බර | වර්ෂය පුරා | 06 | 1110 | |
| | වැලිකඩ (කාන්තා) | අවු. 01 | 12 | 280 | |
| | කො.රි.බ | - | 24 | 72 | |

05.9 **රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය (වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)**

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| මානසික සංවර්ධන වැඩසටහන | තංගල්ල | අවු. 01 | 12 | 245 | මානසික ආතතිය අවම කිරීම හා මානසික සහනයක් ලබාදීම |

05.10 **නීති ආධාර කොමිෂන් සභාව**

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| නීති ආධාර සායන | අනුරාධපුරය | - | 12 | 70 | නීති උපදෙස් ලබාදීම |
| | වැලිකඩ | - | 04 | 169 | |
| | කෑගල්ල | වර්ෂය පුරා | 04 | 138 | |
| | කො.රි.බ | - | 10 | 805 | |

05.11 **මානව හිමිකම් කොමිසම**

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| නීති ආධාර සායන | කො.රි.බ | - | 4 | 310 | නීති උපදෙස් ලබාදීම |

05.12 ජාතික අධ්‍යාපන ආයතනය

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| විවෘත පාසැල | වැලිකඩ | අවු. 01 | 24 | 30 | අධ්‍යාපන මට්ටම හා රසාස්වාදය දියුණු කිරීම |

05.13. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (කෑගල්ල)

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| විධිමත් අධ්‍යාපනය (අ.පො.ස සා.පෙ) | අඹේපුස්ස | අවු. 01 | 12 | 98 | උසස් අධ්‍යාපනයට යොමුවීමට හැකිවීම |

05.14 සමාජ සේවා අමාත්‍යාංශය හා පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| සිරකරුවන්ගේ පවුල් සුභසාධනය සහිත පසුභාර ව්‍යාපෘතිය | සියළුම බන්ධනාගාර | වර්ෂය පුරා | - | 812 | රැඳවියන්ගේ යැපෙන්නන් සඳහා සහන සැලසීම |

05.15 ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය

| වැඩසටහන | බන්ධනාගාරය | පාඨමාලා කාලය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැඳවියන්ට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| උපදේශන වැඩසටහන | සියළුම බන්ධනාගාර | වර්ෂය පුරා | 12 | 60 | මානසික ආතතිය අවම කිරීම හා මානසික සහනයක් ලබාදීම. |

# පුනරුත්ථාපන වැඩ සටහන් - සුභසාධක අංශය



අළුත් අවුරුදු උත්සවය - ත. ව. වි.ම. (තල්දෙන)



ශාක්ෂරතා පංති - ත. ව. අ. වි. (අඹේපුස්ස)

ධර්ම දේශනය - ත. ව. වි.ම.
(තල්දෙන)





වෙසක් පහන් කූඩු නිර්මාණය - යාපනය බන්ධනාගාරය



සරස්වතී පූජාව - යාපනය බන්ධනාගාරය

## ගිණුම් අංශය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සියළුම මූල්‍ය පරිපාලන කටයුතු ඉටු කරනු ලබන ගිණුම් අංශයේ 2012 වර්ෂයේ කාර්යසාධනය පහත පරිදිවේ.

### 01. පුනරාවර්ථන හා මූලධන වියදම්

| ඇස්තමේන්තුව | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | | | | සමුච්චිත වියදම් | |
|---|---|---|---|---|---|---|
| | මුල් ඇස්තමේන්තුව | අඩු කිරීම් (9%, 2%) | අමතර ප්‍රතිපාදන හා ප්‍රතිපාදන මාරු කිරීම් | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව | දෙසැම්බර් මස අවසානයට වියදම් | වියදම ප්‍රතිපාදන වල % ලෙස |
| **මූලධන** | | | | | | |
| පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් | 33,000,000.00 | (2,500,000.00) | – | 30,500,000.00 | 29,907,378.00 | 98.06 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 390,000,000.00 | (35,520,000.00) | – | 354,480,000.00 | 231,848,925.00 | 65.41 |
| පුහුණු හා හැකියා වර්ධනය | 5,000,000.00 | (500,000.00) | – | 4,500,000.00 | 4,125,909.00 | 91.69 |
| **මූලධන එකතුව** | **428,000,000.00** | **(38,520,000.00)** | **–** | **389,480,000.00** | **265,882,212.00** | **68.27** |
| **පුනරාවර්ථන** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 1,893,000,000.00 | | – | 1,893,000,000.00 | 1,798,709,360.00 | 95.02 |
| ගමන් වියදම් | 77,000,000.00 | | – | 77,000,000.00 | 76,969,504.00 | 99.96 |
| සැපයුම් | 1,376,305,000.00 | (70,651,100.00) | 46,000,000.00 | 1,351,653,900.00 | 1,272,961,576.00 | 94.18 |
| නඩත්තු වියදම් | 27,750,000.00 | | 5,000,000.00 | 32,750,000.00 | 33,374,171.00 | 101.91 |
| ගිවිසුම් ගත සේවා | 147,500,000.00 | | 43,000,000.00 | 190,500,000.00 | 204,294,871.00 | 107.24 |
| මාරු කිරීම් | 11,000,000.00 | | 6,000,000.00 | 17,000,000.00 | 17,762,275.00 | 104.48 |
| **පුනරාවර්ථන එකතුව** | **3,532,555,000.00** | **(70,651,100.00)** | **100,000,000.00** | **3,561,903,900.00** | **3,404,071,757.00** | **95.57** |
| **මුළු එකතුව** | **3,960,555,000.00** | **(109,171,100.00)** | **100,000,000.00** | **3,951,383,900.00** | **3,669,953,969.00** | **92.88** |

**02**. සංවර්ධන ව්‍යාපෘතිවලට අදාල මූලධන වියදම්. (වැය විෂය අංක 2104 හා 2502)

| ව්‍යාපෘතියේ/වැඩසටහනේ නම | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.) | සමුච්චිත වියදම ජනවාරි සිට දෙසැම්බර් මස අවසානයට | |
|---|---|---|---|
| | | වියදම (රු.) | වියදම ප්‍රතිපාදන වල % ලෙස |
| පල්ලේකැලේ බන්ධනාගාරය ඉදිකිරීම | 204,000,000.00 | 141,459,019.00 | 69.34 |
| යාපනය බන්ධනාගාරය ඉදිකිරීම | 55,000,000.00 | 48,743,544.00 | 88.62 |
| දැයට කිරුළ ආයෝජන - අනුරාධපුර සිර වාට්ටුව | 10,000,000.00 | 9,891,720.00 | 98.92 |
| අනෙකුත් ඉදිකිරීම් | 27,500,000.00 | 11,273,263.00 | 40.99 |
| **එකතුව** | **296,500,000.00** | **211,367,546.00** | **71.29** |

03. මූලධන වියදම් (වැය විෂය අනුව) (රුපියල්)

| වැය විෂය අංකය | විස්තරය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව 2012 | සමුච්චිත වියදම් 2012.12.31 දිනට | වියදම ප්‍රතිපාදන වල % ලෙස | ඉතිරි ප්‍රතිපාදන |
|---|---|---|---|---|---|
| | **පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්** | **30,500,000.00** | **29,907,378.00** | **98.06** | **592,622.00** |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 19,000,000.00 | 18,536,235.00 | 97.56 | 463,765.00 |
| 2002 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,500,000.00 | 2,387,055.00 | 95.48 | 112,945.00 |
| 2003 | වාහන | 9,000,000.00 | 8,984,089.00 | 99.82 | 15,911.00 |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **354,480,000.00** | **231,848,925.00** | **65.41** | **122,631,075.00** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 35,980,000.00 | 13,766,449.00 | 38.26 | 22,213,551.00 |
| 2103 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 22,000,000.00 | 6,714,930.00 | 30.52 | 15,285,070.00 |
| 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 286,500,000.00 | 201,475,826.00 | 70.32 | 85,024,174.00 |
| 2502 | දැයට කිරුළ ආයෝජන | 10,000,000.00 | 9,891,720.00 | 98.92 | 108,280.00 |
| | **පුහුණු හා හැකියා වර්ධනය** | **4,500,000.00** | **4,125,909.00** | **91.69** | **374,091.00** |
| 2401 | පුහුණු | 4,500,000.00 | 4,125,909.00 | 91.69 | 374,091.00 |
| | **මූලධන වියදම් එකතුව** | **389,480,000.00** | **265,882,212.00** | **68.27** | **123,597,788.00** |

04. **ආදායම් ශීර්ෂ වල කාර්යසාධනය**

| ආදායම් ශීර්ෂය | ඇස්තමේන්තු ගත ආදායම 2012 | සත්‍ය වියදම 2012.12.31 දිනට | 2011 වසරේ සත්‍ය වියදම |
|---|---|---|---|
| 2002.01.01 - රජයේ ගොඩනැගිලි කුලී | 11,000,000.00 | 7,313,330.00 | 11,865,113.00 |
| 2002.02.99 - පොලී ආදායම | 12,000,000.00 | 8,407,307.00 | 12,841,521.00 |
| 2003.02.99 - විකුණුම් පරිපාලන ගාස්තු | 10,000,000.00 | 6,328,731.00 | 52,919,473.00 |
| 2001.03.00 - අත්තිකාරම් ගිණුම් වෙළඳ | 40,000,000.00 | 39,427,871.00 | – |
| 2006.02.00 - ප්‍රාග්ධන වත්කම් විකිණීම | – | – | 6,334,775.00 |
| **මුළු ආදායම** | **73,000,000.00** | **61,477,239.00** | **83,960,882.00** |

05. **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

| විස්තරය | අනුමත සීමාව 2012 | සත්‍ය වියදම 2012.12.31 දිනට | 2011 වසරේ සත්‍ය වියදම |
|---|---|---|---|
| උපරිම හර සීමාව | 140,000,000.00 | 75,630,661.00 | 124,007,897.00 |
| අවම ලැබීම් සීමාව | 110,000,000.00 | 120,577,422.00 | 119,255,567.00 |
| උපරිම හර ශේෂ සීමාව | 500,000,000.00 | 284,321,472.00 | 329,268,234.00 |

06. **ආදායම් ශීර්ෂ වල කාර්යසාධනය**

| ආදායම් ශීර්ෂය | ඇස්තමේන්තු ගත ආදායම 2012 | සත්‍ය ආදායම 2012.12.31 දිනට | 2011 වසරේ සත්‍ය ආදායම |
|---|---|---|---|
| 2002.01.01 - රජයේ ගොඩනැගිලි කුලී | 11,000,000.00 | 11,639,079.00 | 11,865,113.00 |
| 2002.02.99 - පොලී ආදායම | 12,000,000.00 | 12,301,635.00 | 12,841,521.00 |
| 2003.02.99 - විකුණුම් පරිපාලන ගාස්තු | 10,000,000.00 | 9,287,842.00 | 52,919,473.00 |
| 2001.03.00 - අත්තිකාරම් ගිණුම් වෙළඳ | 40,000,000.00 | 39,427,871.00 | – |
| 2006.02.00 - ප්‍රාග්ධන වත්කම් විකිණීම | – | – | 6,334,775.00 |
| **මුළු ආදායම** | **73,000,000.00** | **72,656,427.00** | **83,960,882.00** |

# ඉංජිනේරු අංශය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශය කොටස් දෙකකින් ක්‍රියාත්මක වේ.

- යාන්ත්‍රික ඉංජිනේරු අංශය
- සිවිල් ඉංජිනේරු අංශය

## 1. යාන්ත්‍රික ඉංජිනේරු අංශය

දිවයින පුරා පිහිටි බන්ධනාගාර ආයතනවල සියළුම වාහන නඩත්තු කටයුතු සිදුකරනු ලබන්නේ යාන්ත්‍රික ඉංජිනේරු අංශය මගිනි. එම අංශයේ 2012 වසරේ කාර්ය සාධනය පහත පරිදිවේ.

| දිනය | ආයතනය | කාර්යය | වියදම |
|---|---|---|---|
| 2012.01.16 | වැලිකඩ | 18-9346 - වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියාව | 49,700.00 |
| 2012.01.16 | කො.රි.බ. | 62-1276 - ගියර් පෙට්ටිය අළුත්වැඩියාව | 43,600.00 |
| 2012.01.25 | මුලස්ථානය | 301-5498 - තිරිංග පද්ධතිය අළුත්වැඩියාව | 47,055.00 |
| 2012.01.30 | මුලස්ථානය | 252-5064 - පවර් ස්ටියරින් පද්ධතිය අළුත්වැඩියාව | 42,140.00 |
| 2012.02.01 | මුලස්ථානය | පී.ඒ.8709 - වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියාව | 80,416.00 |
| 2012.02.03 | මුලස්ථානය | ජේ.එන්6474 - වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියාව | 66,500.00 |
| 2012.02.03 | ප.වි.පු.ම. | 250-4623 - නව පවර් ස්ටියරින් පෙට්ටියක් සවිකිරීම | 94,890.00 |
| 2012.02.10 | මුලස්ථානය | 301-5498 - ෂොකැබ්සෝබර් යෙදීම | 49,980.00 |
| 2012.02.17 | අනුරාධපුරය | 18-4923 - එන්ජිම අළුත්වැඩියාව | 32,150.00 |
| 2012.03.05 | මුලස්ථානය | පී.ඩී.4394 කැබ් - කාපට් අළුතින් යෙදීම | 28,673.52 |
| 2012.03.13 | මුලස්ථානය | 18-8098 - එන්ජිම පූර්ණ අළුත්වැඩියාව | 25,040.00 |
| 2012.03.21 | කුරුවිට | 62-4417 - තිරිංග අළුත්වැඩියාව | 76,455.00 |
| 2012.03.21 | මුලස්ථානය | 301-5498 - ක්ලච් පොම්පය අළුතින් යෙදීම | 28,980.00 |
| 2012.03.26 | ත්‍රිකුණාමලය | 19-3623 - එන්ජිම අළුත්වැඩියාව | 69,300.00 |
| 2012.03.26 | මුලස්ථානය | 18-8098 - වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියාව | 44,400.00 |
| 2012.03.27 | වැලිකඩ | 301-5557 - සස්පෙන්ෂන් අළුත්වැඩියාව | 39,450.00 |
| 2012.03.27 | කො.රි.බ. | පී.කේ.1041 - ඉන්ජෙක්ටර් යොදා ප්‍රෙෂර් කිරීම | 48,700.00 |
| 2012.03.27 | මාතර | 63-2904 - රේඩියේටර් අළුතින් යෙදීම | 48,050.00 |
| 2012.04.04 | කළුතර | 62-3335 - ටින්කරින්, ජේන්ටින් | 36,900.00 |
| 2012.04.04 | අනුරාධපුරය | 18-4923 - ටින්කරින්, ජේන්ටින් | 85,000.00 |
| 2012.04.09 | මුලස්ථානය | පී.ඩී 4394 - නව කැනපියක් සවි කිරීම | 50,000.00 |
| 2012.04.09 | මුලස්ථානය | පී.ඒ. 8709 - ස්ටාටර් මෝටරය අළුත්වැඩියාව | 48,496.00 |

| | | | |
|---|---|---|---|
| 2012.04.09 | මහර | 252-3601 - ටයිමින් බෙල්ට් යෙදීම | 48,200.00 |
| 2012.04.09 | මුලස්ථානය | 252-5064 - ෂොකැබ්සෝබර් අළුතින් යෙදීම | 44,510.00 |
| 2012.04.16 | වැලිකඩ | 301-5557 - ෂොකැබ්සෝබර් අළුතින් යෙදීම | 41,250.00 |
| 2012.04.17 | කෑගල්ල | 250-4655 - ටයිමින් බෙල්ට් යෙදීම | 36,290.00 |
| 2012.04.30 | ගාල්ල | පී.ඩී.6599 - පවර් ස්ටියරින් අළුත්වැඩියාව | 24,325.32 |
| 2012.05.03 | මුලස්ථානය | 18-8098 - ෂොකැබ්සෝබර් යෙදීම | 48,740.00 |
| 2012.05.10 | මැගසින් | 19-9330 - ෂොකැබ්සෝබර් අළුතින් යෙදීම | 78,850.00 |
| 2012.05.10 | මුලස්ථානය | 252-5064 - අපර් ආර්ම්, බෝල් ජොයින්ට් අළුතින් යෙදීම | 48,900.00 |
| 2012.05.14 | මොණරාගල | 18-6357 - වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියාව | 25,150.00 |
| 2012.05.14 | මුලස්ථානය | 18-8098 - පවර් ස්ටියරින් පද්ධතිය අළුත්වැඩියාව | 32,000.00 |
| 2012.05.15 | මුලස්ථානය | 252-5064 - විදුලි පද්ධතිය අළුත්වැඩියාව | 43,000.00 |
| 2012.05.17 | මුලස්ථානය | කේ.ඞී.3718 - වායුසමීකරණ පද්ධතිය අළුත්වැඩියාව | 43,200.00 |
| 2012.05.18 | මුලස්ථානය | ජේ.එන්6474 - ඕල්ටනේටරය අළුත්වැඩියාව | 16,495.00 |
| 2012.05.18 | මහනුවර | පී.සී.5001 - තිරිංග අළුත්වැඩියාව | 46,700.00 |
| 2012.05.22 | මහනුවර | 41ශ්‍රී8320 - ටින්කරින්, පේන්ටින් | 65,000.00 |
| 2012.05.25 | කළුතර | එන්.ඒ.6911 - ආරක්ෂිත දැල් අළුතින් සවි කිරීම | 43,000.00 |
| 2012.05.28 | කො.රි.බ. | 253-5217 - පවර් ස්ටියරින් රැක් යෙදීම | 29,900.00 |
| 2012.05.31 | යාපනය | 300-5477 - සස්පෙන්ෂන් පද්ධතිය අළුතින් යෙදීම | 164,860.00 |
| 2012.05.31 | මැගසින් | 19-9330 - රිම් 04 යෙදීම | 7,000.00 |
| 2012.06.07 | මහර | 252-3601 - හෙඩ් ඉන්ජෙක්ටර් පොම්ප අළුත්වැඩියාව | 73,050.00 |
| 2012.06.11 | මුලස්ථානය | 250-4623 - වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියාව | 36,150.00 |
| 2012.06.11 | ත්‍රිකුණාමලය | එච්.එම්.8653 - ෂොකැබ්සෝබර් අළුතින් යෙදීම | 8,500.00 |
| 2012.06.11 | වැලිකඩ | 301-5557 - වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියාව | 42,150.00 |
| 2012.06.13 | මොණරාගල | පී.කේ.5287 - සුක්කානම් පද්ධතිය අළුත්වැඩියාව | 27,910.00 |
| 2012.06.13 | කො.රි.බ. | 62-1278 - ටින්කරින්, පේන්ටින් | 34,500.00 |
| 2012.06.14 | ගාල්ල | එන්.ඒ.6908 - මුහුණත අළුත්වැඩියාව | 79,344.00 |
| 2012.06.19 | මොණරාගල | 62-334 - එන්ජිම අළුත්වැඩියාව | 15,660.00 |
| 2012.06.21 | මහර | පී.ඩී.6587 - එන්ජිම අළුත්වැඩියාව | 25,553.00 |
| 2012.06.21 | මහනුවර | 60ශ්‍රී0040 - එන්ජිම අළුත්වැඩියාව | 03,280.00 |
| 2012.06.21 | කො.රි.බ. | 62-3336 - එන්ජිම අළුත්වැඩියාව | 20,405.00 |
| 2012.06.21 | යාපනය | 300-5477 - ඩෙල්කෝ යුනිට් අළුතින් යෙදීම | 24,700.00 |
| 2012.06.21 | කො.රි.බ. | 60ශ්‍රී0042 - එන්ජිම අළුත්වැඩියාව | 91,970.00 |
| 2012.06.21 | අනුරාධපුරය | පී.සී.5249 - එන්ජිම අළුත්වැඩියාව | 44,915.00 |

| | | | |
|---|---|---|---|
| 2012.06.21 | මීගමුව | පී.ඩී.6556 - එන්ජිම අළුත්වැඩියාව | 06,800.00 |
| 2012.06.21 | ප.වි.පු.ම. | 57-8622 - ටින්කරින්, පේන්ටින් | 66,125.00 |
| 2012.06.21 | කො.රි.බ. | පී.සී.5247 - ක්‍රෑන්ක් ඔයිල් සීල් යෙදීම | 21,205.00 |
| 2012.06.25 | කො.රි.බ. | 60-5722 - ඉන්ජෙක්ටර් පොම්පය අළුත්වැඩියාව | 35,165.00 |
| 2012.07.09 | මුලස්ථානය | 301-5499 - ක්ලච් පද්ධතිය අළුත්වැඩියාව | 33,490.00 |
| 2012.07.11 | මුලස්ථානය | 18-8098 - ගියර් බොක්ස් යෙදීම | 86,175.00 |
| 2012.07.12 | මැගසින් | 19-9330 - වායුසමීකරණ පද්ධතිය අළුත්වැඩියාව | 18,350.00 |
| 2012.07.13 | මුලස්ථානය | 252-5064 - ආසන කට්ටලයක් යෙදීම | 97,600.00 |
| 2012.07.19 | වටරැක | පී.ඒ.4325 - තට්ටුව අළුත්වැඩියාව | 31,400.00 |
| 2012.07.19 | අනුරාධපුරය | එන්.ඒ.6910 - ස්ටාටර් මෝටර්, ක්ලච් අළුතින් යෙදීම | 65,400.00 |
| 2012.07.26 | පල්ලේකැලේ | 49-7616 - එන්ජිම අළුත්වැඩියාව | 29,650.00 |
| 2012.07.27 | කො.රි.බ. | 61-6124 - ටින්කරින්, පේන්ටින් | 33,125.00 |
| 2012.07.30 | මුලස්ථානය | පී.වයි.688 - ස්ටාටර් මෝටර් අළුත්වැඩියාව | 25,929.02 |
| 2012.07.30 | මැගසින් | 207-1482 - එන්ජිම අළුත්වැඩියාව හා තීන්ත ආලේප කිරීම | 204,351.00 |
| 2012.07.30 | මුලස්ථානය | 18-8098 - ස්පීඩෝ මීටර් යෙදීම | 7,150.00 |
| 2012.08.02 | මැගසින් | පී.ඩී.6605 - ස්ටාටර් මෝටර් අළුත්වැඩියාව | 17,250.00 |
| 2012.08.08 | කෑගල්ල | පී.සී.5248 - එන්ජිම අළුත්වැඩියාව | 10,000.00 |
| 2012.08.08 | වටරැක | පී.ඒ.4325 - ඇළුමිනියම් ආවරණ යෙදීම | 31,500.00 |
| 2012.08.08 | මුලස්ථානය | ජේ.එන්.6438 - ඉන්ජෙක්ටර් සම්පූර්ණ අළුත්වැඩියාව | 162,159.20 |
| 2012.08.13 | අනුරාධපුරය | පී.ඩී.6607 - එන්ජිම අළුත්වැඩියාව | 27,840.00 |
| 2012.08.16 | මුලස්ථානය | 250-4650 - එන්ජිම අළුත්වැඩියාව, ටින්කරින්, තීන්ත ආලේප කිරීම | 860,441.00 |
| 2012.08.22 | මහනුවර | 62-3335 - ආසන අළුත්වැඩියාව | 25,716.89 |
| 2012.08.24 | මහනුවර | පී.ඩී.6585 - ආසන අළුත්වැඩියාව | 25,716.89 |
| 2012.08.24 | මහනුවර | 63-2914 - ආසන අළුත්වැඩියාව | 25,716.89 |
| 2012.08.24 | වැලිකඩ | 48-3103 - රේඩියේටරය අළුතින් යෙදීම | 36,500.00 |
| 2012.08.27 | කුරුවිට | 63-2898 - අනතුරට අදාලව ටින්කරින්, පේන්ටින් | 95,000.00 |
| 2012.08.27 | මඩකලපුව | පී.ඩී. 6591 - ආසන අළුත්වැඩියාව | 49,500.00 |
| 2012.08.27 | මුලස්ථානය | ජේ.එන්.6438 - ඉන්ජෙක්ටර් අළුත්වැඩියාව | 88,698.60 |
| | | **එකතුව** | **8,984,088.81** |

## 2. සිවිල් ඉංජිනේරු අංශය

ඉජිනේරු වරුන් දෙදෙනෙක් යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය මගින් දිවයින පුරාම විසිරී පවතින බන්ධනාගාර ආයතනයන්ගේ ඉදිකිරීම් කටයුතු පිළිබඳ අධීක්ෂණය කිරීම සිදුකරයි. ඉදිකිරීම් කොටස් දෙකකි.

1. නව ඉදිකිරීම්

2. ගොඩනැගිලි අළුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම

**2 .1. නව ඉදිකිරීම්**

**2.1.1.** බෝගම්බර බන්ධනාගාරය පල්ලේකැලේ ස්ථාපිත කිරීම සඳහා 2012 වර්ෂයේ දෙවන අදියර යටතේ රු141,459,019.00 වැය කර ඇති අතර මුළුතැන්ගෙයි හා ගබඩාවේ ඉදිකිරීම් 95 % අවසන් කර ඇත. සිර වාට්ටු ගොඩනැගිලි ඉදිකිරීම් 45 % අවසන් කර ඇත. මීට අමතරව ජල විදුලි හා දුරකථන අවශ්‍යතා සපුරාලීමේ කටයුතු ඉටුකර ඇත.

**2.1.2.** යාපනය නව බන්ධනාගාරය ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ රු 48,743,544.00 වැය කර ඇති අතර පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 16 % ක් ද, තාප්පයේ ඉදිකිරීම් 36 %ක් ද, අවසන් කර ඇත.

**2.1.3.** අනුරාධපුරයේ සිර වාට්ටු ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ රු. 9,891,719.84 ක් වැය කර ඇති අතර ඉදිකිරීම් 62 % අවසන් කර ඇත.

**2.1.4.** පොලොන්නරුව බන්ධනාගාරයේ අධිකාරී නිල නිවස ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ රු.මිලියන 2.2 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබා දී ඇති අතර අත්තිවාරම 100 % අවසන් කර ඇත.

**2.1.5.** වාරියපොල බන්ධනාගාරයේ අධිකාරී නිල නිවස ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ රු.මිලියන 1.329 ක් වැය කර ඇති අතර ඉදිකිරීම් 10 % අවසන් කර ඇත.

**2.1.6.** වටරැක බන්ධනාගාරයේ තාප්පය ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ රු.මිලියන 2.183 වැයකර ඇති අතර තාප්පයේ ඉදිකිරීම් 50 % අවසන් කර ඇත.

**2.1.7.** තංගල්ල බන්ධනාගාරය විතැන් කිරීමේ ව්‍යාපෘතිය සඳහා උපදේශක සේවාව ලබාගැනිම සඳහා ගිවිසුම් අත්සන් කර අදාල ගෙවීම් කිරීම සඳහා කටයුතු සිදුකර ඇත

**2.1.8.** ත්‍රිකුණාමලය බන්ධනාගාරයේ අධිකාරී නිල නිවස ඉදිකිරීම, වව්නියාව බන්ධනාගාරයේ බැරක්කය සහ මන්නාරම සිර මැදිරිය ඉදිකිරීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා 2011 වර්ෂයේ ඉදිකිරීම් අවසන්කල හා ඉදිකිරීම් කරමින් පැවති පහත කාර්යයන් සඳහා වැයකර ඇත.

I. පොලොන්නරුව බන්ධනාගාරයේ මළ අපවහන පද්ධතිය ඉදිකිරීම සඳහා රු.427,514.00 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වැයකර ඇති අතර ඉදිකිරීම් අවසන් කර ඇත.

II. මහර බන්ධනාගාරයේ නිළධාරී විවේකාගාරය ඉදිකිරීම සඳහා රු.49,397.86 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වැයකර ඇති අතර ඉදිකිරීම් අවසන් කර ඇත.

III. වව්නියාව බන්ධනාගාරයේ මුළුතැන්ගෙය හා ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.3,450,844.86 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වැයකර ඇති අතර ඉදිකිරීම් අවසන් කර ඇත.

IV. වාරියපොල බන්ධනාගාරයේ ගෙට්ටුකාමරය හා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.198,706.38 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වැයකර ඇති අතර ඉදිකිරීම් අවසන් කර ඇත.

**V.** වාරියපොල බන්ධනාගාරයේ නර්ඩ් තාක්ෂණ සිර වාට්ටු ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු.1,135,080.00 වැය කර ඇත. පළමු මහලේ කුළුණු සිටුවීම අවසන් වී ඇති අතර ඉහල මහල සඳහා කුළුණු හා තට්ටුව සඳහා වැරගැන්නුම් බාල්ක සපයා ඇත.

VI. විරවිල සිර වාට්ටුව ඉදිකිරීම සඳහා රු.500,000.00 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වැයකර ඇති අතර ඉදිකිරීම් අවසන් කර ඇත.

VII. කුරුවිට බන්ධනාගාරයේ ජල සැපයුම් පද්ධතිය ඉදිකිරීම සඳහා රු.1,807,411.26 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වැයකර ඇති අතර ඉදිකිරීම් අවසන් කර ඇත.

**VIII.** වටරැක බන්ධනාගාරයේ නිල නිවාස සංකීර්ණය ඉදිකිරීම. මේ සඳහා මෙම වසරේදී රු. 192,069.23 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවා ඇති අතර ඉදිකිරීම් අවසන් කර ඇත.




දැනට ඉදිකෙරෙමින් පවතින යාපනය බන්ධනාගාර සංකීර්ණය.




නොබෝ දිනකින් විවෘත කිරීමට නියමිත පල්ලේකැලේ නව බන්ධනාගාර සංකීර්ණයේ කොටසක්




පල්ලෙකැලේ නව බන්ධනාගාරයෙහි නොබෝ දිනකින් ඇරඹෙන කාන්තා අංශයෙහි කාන්තාවන් සමග පැමිනෙන දරුවන් සඳහා ඉදිවූ දාරකාගාරය රැඳවි දැතින් වර්ණවත් වූ අයුරු

## 2.2 ගොඩනැගිලි අළුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම.

2012.01.01 සිට 2012.12.31 දින දක්වා ගොඩනැගිලි අළුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම සඳහා රු. 18,536,234.93 ක මුදලක් වැය කර ඇත. එම වියදම් පහත පරිදි වේ.

| බන්ධනාගාර ආයතනය | වියදම |
|---|---|
| බන්ධනාගාර මූලස්ථානය | 115,000.00 |
| වැලිකඩ බන්ධනාගාරය | 5,711,509.12 |
| කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | 1,860,084.50 |
| මැගසින් බන්ධනාගාරය | 1,918,783.76 |
| බදුල්ල රිමාන්ඩ් බන්ධනාගාරය | 474,669.25 |
| ගාල්ල රිමාන්ඩ් බන්ධනාගාරය | 127,225.00 |
| මාතර රිමාන්ඩ් බන්ධනාගාරය | 299,052.00 |
| වීරවිල එළිමහන් වැඩ කඳවුර | 278,150.50 |
| තංගල්ල රිමාන්ඩ් බන්ධනාගාරය | 450,610.00 |
| බූස්ස රිමාන්ඩ් බන්ධනාගාරය | 807,727.20 |
| වටරැක එළිමහන් වැඩ කඳවුර | 162,368.00 |
| කළුතර රිමාන්ඩ් බන්ධනාගාරය | 1,383,773.25 |
| මීගමුව රිමාන්ඩ් බන්ධනාගාරය | 91,856.50 |
| තල්දෙන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය | 185,782.00 |
| පල්ලේකැලේ එළිමහන් වැඩ කඳවුර | 14,025.00 |
| යාපනය රිමාන්ඩ් බන්ධනාගාරය | 59,372.00 |
| බෝගම්බර බන්ධනාගාරය | 1,462,554.50 |
| මහර බන්ධනාගාරය | 660,530.00 |
| අනුරාධපුර බන්ධනාගාරය | 735,725.00 |
| පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය | 177,149.60 |
| කෑගල්ල රිමාන්ඩ් බන්ධනාගාරය | 1,048,346.00 |
| වාරියපොල රිමාන්ඩ් බන්ධනාගාරය | 439,522.75 |
| පොළොන්නරුව රිමාන්ඩ් බන්ධනාගාරය | 72,419.00 |
| **එකතුව** | **18,536,234.93** |

## පුහුණු අංශය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු හා ඉලක්ක සපුරාලනු වස් කුසලතාවයෙන් පිරිපුන් කාර්යක්ෂම නිළධාරීන් පිරිසක් බිහිකිරීම සඳහා අවශ්‍ය සියළුම පුහුණු කටයුතු මෙම අංශය මගින් සිදුකරනු ලබයි. මෙහිදී දෙපාර්තමේන්තු පුහුණු ආයතනය තුල මෙන්ම ඉන් පිටත වෙනත් පුහුණු ආයතන, සහ විශ්වවිද්‍යාල සම්බන්ධ කරගනිමින් උසස් පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කිරීමට ද කටයුතු කර ඇත. 2012 වසරේ පුහුණු ආයතනයේ කාර්ය සාධනය පහත පරිදි වේ.

**1. අභ්‍යන්තර සහ බාහිර පුහුණු පාඨමාලා (රජයේ ප්‍රතිපාදන මත)**

| අනු අංකය | පාඨමාලාවේ නම | වියදම (රු.මි) |
|---|---|---|
| 1 | රියදුරු පුහුණු පාඨමාලාව | 0.038 |
| 2 | රාජ්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව | 0.179 |
| 3 | කම්කරුවන් හා මුරකරුවන් සඳහා පුහුණුව | 0.006 |
| 4 | රාජ්‍ය කළමනාකරණ පශ්චාද් උපාධිය | 0.100 |
| 5 | කම්කරුවන් හා මුරකරුවන් සඳහා පුහුණුව | 0.001 |
| 6 | බන්ධනාගාර ඉදිරි සැලසුම් සැකසීමේ දෙදින වැඩමුළුව | 0.476 |
| 7 | පුහුණු කටයුතු සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම | 0.013 |
| 8 | මනෝවිද්‍යාත්මක උපදේශන ඩිප්ලෝමාව | 0.065 |
| 9 | සරඹ උපදේශන පුහුණු පාඨමාලාව | 0.032 |
| 10 | ජේලර් හා සුභසාධක නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලාව | 0.043 |
| 11 | කෘෂිකර්ම පුහුණු පාඨමාලාව | 0.020 |
| 12 | හෙද නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලාව | 0.005 |
| 13 | ඕවර්සියර් /නියාමක නිලධාරීන් සඳහා දෙදින වැඩළුව | 0.011 |
| 14 | වෘතීය උපදේශක පුහුණු පාඨමාලාව | 0.079 |
| 15 | අපරාධ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව | 0.018 |
| 16 | සුභසාධක නිලධාරීන් සඳහා එක්දින වැඩමුළුව | 0.079 |
| 17 | දෙමළ භාෂා පුහුණුව | 0.016 |
| 18 | සමාජ සුභසාධක පුහුණු පාඨමාලාව | 0.059 |
| 19 | බන්ධනාගාර අධිකාරි /සහකාර අධිකාරි රැස්වීම | 0.004 |
| 20 | ගිණුම් කරණය සම්බන්ධ මූලික පුහුණුව | 0.005 |
| 21 | ජලනල තාක්‍ෂණ පුහුණු පාඨමාලාව | 0.008 |
| 22 | මත්ද්‍රව්‍ය ආශ්‍රිත පුහුණු පාඨමාලාව | 0.020 |

| | | |
|---|---|---|
| 23 | ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව | 0.120 |
| 24 | වාණිජ මණ්ඩල පිළිබඳ පුහුණුව | 0.017 |
| 25 | දැයට කිරුළ ප්‍රදර්ශන චිත්‍රපටය නිෂ්පාදනය කිරීම සඳහා | 0.086 |
| 26 | ගල්කිරියාගම පුහුණු පාසල සඳහා ගෙවිය යුතු ඉතිරි මුදල ගෙවීම | 0.062 |
| 27 | ආධුනික බන්ධනාගාර නියාමක පුහුණු පාඨමාලාව. | 0.009 |
| 28 | විශ්‍රාම වැටුප් සකස්කිරීම හා ලිපිගොනු පවත්වාගෙන යාම පිළිබඳව දෙදින වැඩමුළුව | 0.100 |
| 29 | ආධුනික බන්ධනාගාර නියාමක පුහුණු පාඨමාලාව. | 0.157 |
| 30 | වදක නිලධාරීන් බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණය | 0.006 |
| 31 | හයිබ්‍රිඩ් වාහන තාක්ෂණය පිළිබඳ එක් දින වැඩමුළුව | 0.003 |
| 32 | සේවා කළමණාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය. | 0.060 |
| 33 | ඵලදායිතාව පිළිබඳ වැඩමුළුව | 0.003 |
| 34 | ආධුනික බන්ධනාගාර නියාමක පුහුණු පාඨමාලාව. | 0.267 |
| 35 | මානව සම්පත් කළමණාකරණය පිළිබඳ වැඩමුළුව | 0.008 |
| 36 | පර්යේෂණ සඳහා තොරතුරු එක්රුස් කිරීම වෙනුවෙන් 50% ක් ගෙවීම (Sri Lanka Nautical & Aero Service Private Limited) | 0.273 |
| 37 | ආධුනික බන්ධනාගාර නියාමක පුහුණු පාඨමාලාව. | 0.451 |
| 38 | ද්‍රවිඩ භාෂා පුහුණුව | 0.002 |
| 39 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ගබඩා භාරකරුගේ රාජකාරී පිළිබඳ වැඩමුළුව. | 0.071 |
| 40 | භාෂා පරිවර්ථන ගාස්තු ගෙවීම. (A Ariyapratha) | 0.013 |
| 41 | කර්මාන්ත ගිණුම සකස්කිරීම පිළිබඳ වැඩමුළුව | 0.009 |
| 42 | විනය කාර්යය පටිපාටිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | 0.158 |
| 43 | සුභසාධක නිලධාරීන් සඳහා වැඩමුළුව. | 0.130 |
| 44 | මානව සම්පත් කළමණාකරණ පාඨමාලාව (NIBM) | 0.030 |
| 45 | මානව සම්පත් කළමණාකරණ වැඩමුළුව (ඵලදායීතා සංවර්ධන අමාත්‍යංශය) | 0.004 |
| 46 | උපදේශනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව. (NSD) | 0.143 |
| 47 | පර්යේෂණ සඳහා තොරතුරු එක්රුස් කිරීම වෙනුවෙන් ඉතිරි 50% ගෙවීම. (Sri Lanka Nautical & Aero Services Private Limited) | 0.273 |
| | **එකතුව** | **3.732** |

02 බන්ධනාගාර රැඳවියන් සඳහා පුහුණු පාඨමාලා

| බන්ධනාගාර ආයතනය | පාඨමාලාව | වියදම (රු.මි) |
|---|---|---|
| වටරැක එ.සි.ක. | සිමෙන්ති බීරළු, මල්පෝච්චි, බ්ලොක් ගල් නිශ්පාදන පාඨමාලාව | 0.181 |
| | ගෘහස්ථ විදුලි කාර්මික පාඨමාලාව | 0.027 |
| වාරියපොල බන්ධනාගාරය | කාන්තා හා ළමා ඇඳුම් මැසීම | 0.071 |
| | ගෘහස්ථ විදුලි රැහැන් ඇදීම | 0.040 |
| | පෙදරේරු ශිල්පය | 0.026 |
| මොණරාගල රිමාන්ඩ් බන්ධනාගාරය | අධිවේගී මැහුම් පාඨමාලාව | 0.022 |
| | විදුලි කාර්මික පාඨමාලාව | 0.028 |
| **එකතුව** | | **0.395** |

## 03. ආධාර මත සිදුකළ පුහුණු වැඩසටහන්

| අංකය | පාඨමාලාවේ නම | තනතුර | සහභාගි වූ සංඛ්‍යාව | මුදල |
|---|---|---|---|---|
| 01 | පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන (කොළඹ විශ්ව විද්‍යාලය) | I පෙළ ජේලර් II පෙළ ජේලර් | 40 | UNDB ආධාර |
| 02 | මානව හිමිකම් පිළිබඳ තෙදින වැඩමුළුව (කොළඹ විශ්ව විද්‍යාලය) | ඕවර්සියර්/නියාමක | 60 | UNDB ආධාර |
| 03 | බන්ධනාගාර ගතවූවන් පිළිබඳව සමීක්ෂණය (කොළඹ විශ්ව විද්‍යාලය) | I පෙළ ජේලර්/ I පෙළ සුභසාධක නිලධාරීන් / II පෙළ ජේලර් / II පෙළ සුභසාධක නිලධාරීන් | 15 | UNDB ආධාර |
| 04 | මනෝ සාමාජික ප්‍රශ්න පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව. | / II පෙළ ජේලර් / II පෙළ සුභසාධක නිලධාරීන් /ඕවර්සියර්/නියාමක | 30 | – |

# කර්මාන්ත අංශය

බන්ධනාගාරගත නේවාසිකයින් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රියාවලියේ දී විශේෂ අවධානය යොමුකර ඇත්තේ ඔවුනට වෘත්තීය පුහුණුවක් ලබාදීමටය. ඒ සඳහා විවිධ වෘත්තීය පුහුණු වැඩසටහන් බන්ධනාගාර තුළ ක්‍රියාත්මක වන අතර ඉන් බලාපොරොත්තු වන්නේ නේවාසිකයන් බන්ධනාගාරය තුළ සිටින කාලය තුළ ඔවුන්ට යම් වෘත්තීය දක්ෂතාවයක් ලබාදී කර්මාන්ත වල යෙදවීම තුළින් ඔවුන්ගේ ආකල්ප හා මානසික තත්වය තුලනය කිරීමත් නිදහස් වී ඔවුන් සමාජගතවන අවස්ථාවේදී යම් කර්මාන්තයක නියැලීමෙන් සමාජයට බරක්නොවී ජීවත්විය හැකි පරිසරයක් ඇතිකිරීමත්ය.

**2012 වර්ෂයේ කර්මාන්ත හා කෘෂි කර්මාන්ත අංශයේ කාර්යසාධනය**

| අනු අංක | බන්ධනාගාර ආයතනය | ක්‍රියාත්මක කරන කර්මාන්ත | වියදම | ආදායම |
|---|---|---|---|---|
| 1 | වටරැක | ගොවිපල, සත්ව පාලනය, කොහු/ඉදල් | 338,580.50 | 1,418,458.00 |
| 2 | මහර | කෘෂි කර්මාන්ත, රජක, කම්මල්, කොහු, පේෂකර්ම, මැහුම්, සබන්, වඩු, පෙදරේරු, සත්ව පාලනය, ගඩොල් | 2,717,057.68 | 10,538,605.00 |
| 3 | දළුපොත | පේෂකර්ම, මැහුම්, කොහු මෝල, ගඩොල්, කෘෂිකර්ම, බේකරි, වඩු, කොහු/ඉදල්, රජක, පාවහන්, සබන්, පෙදරේරු | 6,092,164.55 | 9,009,648.00 |
| 4 | බෝගම්බර | කොහු, මැහුම්, කම්මල්, වඩු, පේෂකර්ම, රජක, පෙදරේරු | 5,108,771.65 | 7,785,673.00 |
| 5 | පල්ලෙකැලේ | බේකරිය, ගොවිපල, සත්ව, ගඩොල්, රජක, පේෂකර්ම, මැහුම්, වඩු, කොහු/ඉදල්, සබන්, පෙදරේරු, පාවහන්, හිස්වැසුම්, කම්මල්, ගරාජ් | 11,450,376.98 | 14,531,784.00 |
| 6 | අනුරාධපුර | බේකරි, ගොවිපල, රජක, මැහුම්, කොසු ඉදල්, පේෂකර්ම, සත්වපාලනය, වඩු, ගඩොල් | 8,314,156.35 | 14,552,605.00 |
| 7 | බදුල්ල | රජක, ගොවිපොල | | 42,051.00 |
| 8 | වීරවිල | වගා, කොහු, සත්ව පාලනය, මැහුම්, වඩු, පෙදරේරු, රජක, පේෂකර්ම, කම්මල්, ගඩොල්, | 667,566.50 | 1,685,563.00 |
| 9 | වැලිකඩ | බේකරිය, වඩු, රජක, කම්මල්, කොසු ඉදල්, සබන්, මැහුම්, මුද්‍රණ, පේෂකර්ම, ගඩොල්, ගරාජ්, පෙදරේරු | 19,680,711.11 | 27,488,051.00 |
| 10 | තල්දෙන | ගොවිපල, රජක, මැහුම්, පේෂකර්ම, බේකරි, කොහු ඉදල්, වඩු, පෙදරේරු, ගඩොල්, මුද්‍රණ, වාහන සේවා, සබන්, | 3,737,783.25 | 7,394,676.00 |
| 11 | කුරුවිට | ගොවිපල, සත්ව පාලනය | 1,367,305.00 | 3,607,460.00 |

| | | | | |
|---|---|---|---|---|
| 12 | බූස්ස | ගොවිපල, බේකරි, සත්ව පාලනය, කොහු/ඉදල්, සබන් | 373,427.04 | 972,174.00 |
| 13 | වාරියපොළ | වගා අංශය, පෙදරේරු, සත්වපාලනය, ගඩොල් | 494,080.55 | 1,902,724.00 |
| 14 | පොළොන්නරුව | කෘෂිකාර්මික කටයුතු සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබාදී තිබූ ඉඩම ආපසු පවරා ගැනීම හේතුවෙන් මෙම වසරේ වගා කටයුතු සිදු නොකරන අතර පසුගිය වසරේ ඉතිරි වී ඇති වී අස්වැන්නෙන් මෙම ආදායම් උපයා ඇත. | 63,420.00 | 679,785.00 |
| 15 | තංගල්ල | වගා අංශය, සත්වපාලනය, වඩු | 245,904.50 | 1,381,056.00 |
| **එකතුව** | | | **60,651,305.66** | **102,990,313.00** |

- ආදායම විකුණුම් වටිනාකම මත පදනම් වී ඇත.





**හංගිලිපොල වැඩ කඳවුරේ සාර්ථකව වැවෙන පැපොල් සහ පැණි කොමඩු වගාවන්**






**රැඳවි දෑතින් නිමවූ දැයට කිරුළ ප්‍රදර්ශන භාණ්ඩ**

# බුද්ධි හා ආරක්ෂක අංශය

බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර ඇති බුද්ධි හා ආරක්ෂක අංශය මගින් සිදු කරනුලබන කාර්යයන් ලෙස බන්ධානාගාර ආයතන තුල සිදුවන හදිසි අවස්ථාවන් මැඩලීමට ක්‍රියා කිරීම. කොළඹ බන්ධනාගාර ආයතනවල නිලධාරීන්, රැඳවියන් බැලීමට පැමිණෙන අමුත්තන් සහ රැඳවියන් සෝදිසි කිරීම සිදු කරන අතර එහිදී නීති විරෝධීව කටයුතු කළ පුද්ගලයින්ට විරුද්ධව නඩු පැවරීමත් මෙම සෝදිසි කිරීම් වලදී සොයාගනු ලබන මත්ද්‍රව්‍ය පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශයට සහ බොරැල්ල පොලීසියට භාරදී නීතිමය කටයුතු කිරීමත් සිදුකරනු ලබයි. ජංගම දුරකථන සහ මුදල් සම්බන්ධව කටයුතු කිරීමට ඒවී බන්ධනාගාර අධිකාරීවරුන්ට භාරකරනු ලැබේ. අමාත්‍යාංශයේ නියෝග පරිදි සහ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුමාගේ නියෝග පරිදි කොළඹ අවට හා පිටත බන්ධනාගාර තුල විශේෂ සෝදිසි කටයුතු සිදු කරනු ලබයි. ගරු අමාත්‍යතුමා, ලේකම් තුමා, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්තුමා බන්ධනාගාර තුල කරනු ලබන නිල සංචාර වලදීත්, නිල උත්සව වලදී ආරක්ෂාව සැපයීම සිදුකරනු ලබන්නේ බන්ධනාගාර බුද්ධි හා ආරක්ෂක අංශය මගිනි. මීට අමතරව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුමාගේ නියෝගය පරිදි විශේෂ උත්තමාචාර නිල පෙරෙට්ටු වලට නිලධාරීන් සහභාගි කරවීමත් විශේෂ ගණයේ රැඳවියන් උසාවි වලට ඉදිරිපත් කිරීමේදී ආරක්ෂණය සැපයීමත් මෙම අංශයේ වගකීමක්වේ. ඒ අනුව 2012 වර්ෂයේ මෙම අංශයේ කාර්ය සාධනය පහත පරිදි වේ.

## *01. බන්ධනාගාර ආයතන සෝදිසි කිරීම.*

### 01.1 **කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය**

- 2012-02-16 දින C වාට්ටුව සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 12, ජංගම දුරකථන බැටරි 04, සිම්පත් 03, මුදල් රු. 110/-, හෙරොයින් යැයි සැකකල හැකි කුඩා ගුලි 02ක්, ගංජා බවට සැකකල හැකි කුඩා පැකට් 02ක් සොයාගැනීම.
- 2012-06-02 දින LTTE ත්‍රස්වාදීන් රඳවා සිටින G1 හා G2 වාට්ටු සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 27, ජංගම දුරකථන බැටරි 06, හෑන්ඩ් ෆ්‍රී 10, බැටරි චාජර් 10, සිම්පත් 19ක් සොයා ගන්නා ලදී
- 2012-06-08 දින සුභ සාධක අංශයේතිබී ජංගම දුරකථනයක් අත්අඩංගුවට ගැනීම.
- 2012-07-02 දින සෝදිසියට ලක්කිරීමේදී ජංගම දුරකථන 13, අතිරේක සිම්පත් 03, අතිරේක බැටරි 08, මුදල් රු. 300/- සොයා ගන්නා ලදී.
- 2012-07-18 දින අමුත්තන් පෙන්වන ස්ථානයේ ඇති කසල බඳුන පරීක්ෂා කිරීමේදී ජංගම දුරකථනයක් සහ එටිසෙලාට් සිම්පතක් සොයා ගැනීම.
- 2012-07-20 දින M1, M2 වාට්ටු සෝදිසියට ලක් කිරීමේදී ජංගම දුරකථන 15, හසීස් යැයි සැකකල හැකි බාර් 03, චාජර් 03ක් හා වයර් කැබලි කීපයක් සොයාගන්නා ලදි.
- 2012-09-29 දින පොලිස් විශේෂ කාර්ය බලකාය සමග ඒකාබද්ධ සෝදිසි කිරීමෙන් පසුව ජංගම දුරකතන 126, අමතර සිම් කාඩ් 55, අමතර බැටරි 44, බැටරි ආරෝපණ (චාජර්) 38, හෑන්ඩ් ෆ්‍රී 20, හෙරොයින් යැයි සැකකල හැකි ද්‍රව්‍ය ග්‍රෑම් 05ක් සොයා ගන්නා ලදී.

## 01.2 නව මැගසින් රිමාන්ඩ් බන්ධනාගාරය

- 2012-03-07 දින A වාට්ටුව සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 22, සිම්පත් 13, හෑන්ඩ් ෆ්‍රී 04, දුරකථන ආරෝපණ 07, DVD ප්ලේයර් 01, කැසට් රේඩියෝ 01, මත්ද්‍රව්‍ය යැයි සැක කල හැකි පැකට් 01, දුම්කොල කුඩු පැකට් 01 ක් සොයා ගන්නා ලදී
- 2012-07-11 දින කළු සෝදිසියේදී ජංගම දුරකථන 18 ක් සොයාගන්නා ලදි.

## 01.3 මීගමුව රිමාන්ඩ් බන්ධනාගාරය

- 2012-03-22 වාට්ටු 03ක් සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 19, ජංගම දුරකථන බැටරි 13, සිම්පත් 10, හෑන්ඩ් ෆ්‍රී 02, දුරකථන ආරෝපණ 06, මුදල් රු. 1100/- සොයා ගන්නා ලදී
- 2012-04-04 දින 1-A 01 හා 02 යන වාට්ටු සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 27, ජංගම දුරකථන බැටරි 01, හවුසින් 01, සිම්පත් 16, මුදල් රු. 8360/- සොයා ගන්නා ලදී
- 2012-06-16 දින A3 හා A2 වාට්ටුව සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකතන 19, චාජර් 19, සිම් කාඩ් පත් 15, ගංජා පැකට් 01, මුදල් රු.16340/- සොයා ගන්නා ලදී
- 2012-08-05 දින A1 හා A2 වාට්ටුව සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 14, චාජර් 04, අතිරේක බැටරි 06, සිම්පත් 02 සොයා ගන්නා ලදී.

## 01.4 වැලිකඩ බන්ධනාගාරය

- 2012-03-28 දින වාට්ටු 03ක් සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 11 ක් සොයා ගන්නා ලදී
- 2012-05-23 දින A3 වාට්ටුව සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 08, ජංගම දුරකථන බැටරි 09, බැටරි චාජර් සර්කිට් 03, හෑන්ඩ් ෆ්‍රී 02, සිම්පත් 01, මුදල් රු. 1000/-ඉන්දියන් මුදල් රු. 10/-, හෙරොයින් යැයි සැකකල හැකි පැකට් 02, චරස් පැකට් 20 සොයා ගන්නා ලදී
- 2012-06-07 දින B3 වාට්ටුව සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 11, මුදල් රු. 1085/- සොයා ගන්නා ලදී
- 2012-06-08 දින ප්‍රධාන සුභ සාධක නිලධාරි සතුව තිබී ජංගම දුරකථනයක් අත්අඩංගුවට ගැනීම.
- 2012-06-15 දින A3 වාට්ටුව සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 25, සිම්පත් 15, මුදල් රු. 2000/-, හෑන්ඩ් ෆ්‍රී 04 සොයා ගන්නා ලදී

01.5. **අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරය**

- 2012-06-02 දින LTTE ත්‍රස්වාදීන් උපරිම ආරක්ෂාවක් සහිත රඳවා සිටින වාට්ටුව සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 14ක් සොයා ගන්නා ලදී

01.6. **වව්නියාව රිමාන්ඩ් බන්ධනාගාරය**

- 2012-06-29 දින කළ සෝදිසියේදී ජංගම දුරකථන 25, සිම්පත් 07, මුදල් රු. 22160/- සොයා ගන්නා ලදී.

01.7. **ත්‍රිකුණාමලය රිමාන්ඩ් බන්ධනාගාරය**

- 2012-07-03 දින සෝදිසියකට ලක් කිරීමේදී ජංගම දුරකථන 10, සිම්පත් 05, චාජර් 02, බැටරි 12, මුදල් රු. 200/- සොයා ගන්නා ලදී

01.8. **ගාල්ල රිමාන්ඩ් බන්ධනාගාරය**

- 2012-07-10 දින සෝදිසියට ලක් කිරීමේදී ජංගම දුරකථන 44, සිම්පත් 10, චාජර් 10, බැටරි 08, ගංජා කුඩා පැකට් 01 සොයාගන්නා ලදි.

01.9. **කෑගල්ල රිමාන්ඩ් බන්ධනාගාරය**

- 2012-07-28 දින **A1, A3, A4, B, C, D** වාට්ටු සෝදිසියට ලක් කිරීමේදී මුදල් රු. 6300.00 ක් සොයාගන්නා ලදි.

01.10. **බෝගම්බර බන්ධනාගාරය**

- 2012-08-30 දින සිරකරුවෙකු සෝදිසි කිරීමේදී ජංගම දුරකථන 01, සිම්පත් 01 සොයා ගන්නා ලදී.

01.11. **පල්ලේකැලේ විළිමහන් සිර කඳවුර**

- 2012-09-21 දින පල්ලෙකැලේ විලිමහන් සිරකඳවුරේ අලෙවි සැල සහ අබලි ලී තොග පරීක්ෂා කිරීම.

## 02. රැඳවියන් බැලීමට පැමිණෙන අමුත්තන් සහ ඔවුන් ගෙන එන පාර්සල් සෝදිසි කිරීම.

### 02.1 වැලිකඩ බන්ධනාගාරය

- 2012-01-04 දින රු. 1000.00 ක මුදලක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-01-05 දින රු. 1200.00 ක මුදලක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-01-11 දින රු. 570.00 ක මුදලක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-01-15 සලාක ඇතුලට රැගෙන යන සිරකරුවෙකු පරීක්ෂා කල අවස්ථාවේ සිගරට් පැකට් 02ක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-01-18 දින රු. 500.00 ක මුදලක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-01-20 මුදල් රු. 5500.00 සහ ගංජා ඔතන කොල බණ්ඩල් 01 සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-01-21 දින රු. 500.00 ක මුදලක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-02-04 දින කෑම පාර්සල් තුල සඟවා ගෙන ආ රු. 5500 ක, මුදලක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-02-29 දින මාළු මිරිස් තුල සඟවා ගෙන ආ රු. 200.00 ක මුදලක්, මත්ද්‍රව්‍ය යැයි සැක කළහැකි පැකට් 03ක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ බොරැල්ල පොලීසියට භාර දී ඇත.
- 2012-03-05 දින වඩේ එකක් තුල ඉතා සූක්ෂම ලෙස සඟවා ගෙන ආ රු. 500.00 ක මුදලක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-03-09 දින සිග්නල් ටියුබයක සඟවා ගෙන ආ මත්කුඩු යැයි සැක සහිත ද්‍රව්‍යක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ බොරැල්ල පොලීසියට භාර දී ඇත.
- 2012-03-10 දින බන්ධනාගාර රෝහලේ කටයුතු සිදුකිරීම සඳහා යොදවා සිටි සිරකරුවෙකු බැලීමට පැමිණි පුද්ගලයෙකු ඔහුගේ යට ඇඳුමේ සඟවා ගෙන ආ මත්කුඩු යැයි සැක සහිත ද්‍රව්‍යක් එම සිරකරුට ලබා දීමේදී අත්අඩංගුවට ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ බොරැල්ල පොලීසියට භාර දී ඇත.
- 2012-03-10 දින රු. 2000.00 ක මුදලක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-03-15 දින සබන් කෑල්ලක් තුල ඉතා සූක්ෂම ලෙස සඟවා ගෙන ආ රු. 200.00 ක මුදලක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-03-22 දින සබන් කෑල්ලක් තුල සූක්ෂම ලෙස සඟවා ගෙන ආ රු. 500.00 ක මුදලක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.

- 2012-04-13 දින කැවුමක් තුල සූක්ෂම ලෙස සඟවා ගෙන ආ රු. 2000.00 ක මුදලක් සහ හෙරොයින් යැයි සැකකල හැකි ද්‍රව්‍යක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් සැක සහිත කුඩු බොරැල්ල පොලීසියටත් මුදල් අදාල ආයතනයටත් භාර දී ඇත.
- 2012-04-28 දින සූක්ෂම ලෙස සඟවා ගෙන ආ දුරකථන ආරෝපනයක කොටසක් සොයා ගැනීම සහ පසුව උපක්‍රමශීලිව අදාල සැකකරුගෙන් ජංගම දුරකථනයක් සොයා ගැනීම. සබන් තුල සඟවා ගෙන ආ රු. 100.00ක මුදල් නෝට්ටු 02ක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-05-05 දින වැලිකඩ කාන්තා අංශයේ අමුත්තන් ගෙන එන ලද ආහාර සහ පාර්සල් පරීක්ෂා කිරීමේදී සනීපාරක්ෂක පැකැට්ටුවක සූක්ෂම ලෙස සඟවා ගෙන ආ ජංගම දුරකථනයක්, බැටරියක්, සිම්පත් 02ක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
- 2012-05-16 දින ක්ලෝගාඩ් දන්තාලේපයක් තුල සූක්ෂම ලෙස සඟවා ගෙන ආ මුදල් රු. 2000.00 ක් සොයා ගැනීම. - අත්අඩංගුවට ගත් දෑ අදාල ආයතනයට භාර දී ඇත.
